# තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්යසාධන විගණනය - 2019



වාර්තාවේ අංක.පීඊආර්/ඒ/2020/එස්ඩීජී/2

ජාතික විගණන කාර්යාලය

## පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| 1. | | විධායක සාරාංශය | 1 |
| 2. | | හැඳින්වීම | 6 |
| | 2.1 | පසුබිම | 6 |
| | 2.2 | විගණනය සඳහා අධිකාර බලය | 7 |
| | 2.3 | මාතෘකාව තෝරා ගැනීමට හේතුව | 7 |
| | 2.4 | විගණන ප්‍රවේශය | 7 |
| | 2.5 | විගණන අරමුණු | 7 |
| | 2.6 | විගණන නිර්ණායක | 8 |
| | 2.7 | විගණන නිර්ණායක ප්‍රභවයන් | 9 |
| | 2.8 | ක්‍රමවේදය | 11 |
| | 2.9 | විගණන ප්‍රමිත වලට අදාල වීම | 11 |
| | 2.10 | විගණන විෂය පථය | 11 |
| | 2.11 | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සාන්ද්‍රික ප්‍රජාවගේ සහභාගිත්වය | 12 |
| 03. | | විස්තරාත්මක විගණන සොයාගැනීම් | 13 |
| | 3.1 | 2030 න්‍යාය පත්‍රය ජාතික සන්දර්භයට ඒකාබද්ධ කිරීම | 13 |
| | 3.2 | අයවැය යෝජනා හරහා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම | 21 |
| | 3.3 | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් හඳුනාගැනීම | 40 |
| | 3.4 | 2030 න්‍යාය පත්‍රයේ පසුවිපරම, සමාලෝචනය, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කිරීම | 45 |
| 04. | | නිර්දේශ | 56 |
| 05. | | නිගමනය | 57 |
| | | ඇමුණුම් | 58 |

## 01. විධායක සාරාංශය

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය වඩා හොඳ ලෝකයක් සඳහා වූ විශ්වීය හා ඒකාබද්ධ දැක්මකි. න්‍යාය පත්‍රය අනුව තිරසර සංවර්ධනය යනු අනාගත පරම්පරාවට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාව අනතුරේ හෙළීමෙන් තොරව වර්තමානයේ අවශ්‍යතා සපුරා ගන්නා සංවර්ධනයයි. ශ්‍රී ලංකා රජයද විවිධ පියවර ගනිමින් මෙම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි. මේ සඳහා පාර්ලිමේන්තුව විසින් අදාළ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීමේ කාර්යය සහ විශේෂඥ උපදෙස් සැපයීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කිරීම, තිරසර සංවර්ධනය සඳහා වගකියන රේඛීය අමාත්‍යාංශය ලෙස 2015 වර්ෂයේදී තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය ස්ථාපිත කිරීම, 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත නීතිගත කිරීම, තිරසර සංවර්ධන සභාව ස්ථාපිත කිරීම යනාදිය ගෙන ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග වේ.

උත්තරීතර විගණන ආයතනය ලෙස ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා නියැලෙන රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව හා ඵලදායීත්වය වැඩිකිරීම මඟින් ඒවායෙහි ගිණුම්කටයුතුභාවය, විනිවිදභාවය, අවංකභාවය ශක්තිමත් කිරීමේ අපේක්ෂාවෙන් හා එමඟින් පුරවැසියන්ගේ ජීවිත උසස් කිරීම සඳහා තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීමේ කාර්යසාධන විගණනය 2016 වර්ෂයේ ජනවාරි සිට 2018 වර්ෂයේ අගෝස්තු දක්වා තෝරාගත් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් සිදු කරන ලදී. 2018 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ ඒ සම්බන්ධව වගකීම දරන රාජ්‍ය ආයතන විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කරන ලද කාර්යයන් පිළිබඳව අවධානය යොමු කරන ලදී.

2019 වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා ශ්‍රී ලංකාවේ දැක්ම 2025 දැක්ම වූ අතර, රාජ්‍ය ආයෝජන සැලැස්ම ලෙස ආයෝජන වැඩසටහන (2017 – 2020) භාවිතා කර තිබුණි. 2019 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකාවේ ජාතික දැක්ම ලෙස සෞභාග්‍යයේ දැක්ම භාවිතා කරයි. එම දැක්ම අනුව 2030 වර්ෂයේදී ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා කැබිනට් අමාත්‍යාංශ නැවත සකස් කිරීම හා ඒ සඳහා ක්‍රමානුකූල සැලැස්මක් සකස් කරන බව දක්වා තිබුණි. 2025 දැක්ම හා රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) තිරසර සංවර්ධනයේ පාරිසරික පැතිකඩයට වඩා ආර්ථික හා සාමාජීය පැතිකඩ සමඟ ඒකාබද්ධ කර තිබුණි. තිරසර සංවර්ධනය කරා ශ්‍රී ලංකාව 2030 වර්ෂය වන විට ගමන් කරවීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ නිකුත් කරන ලද චක්‍රලේඛනයක් ප්‍රකාරව නව ව්‍යාපෘති ඇගයීමේදී ඒවා ආර්ථික, සාමාජීය හා පාරිසරික යන පැතිකඩයන් වල සමතුලිතතාව රැකෙන පරිදි අනුගමනය කළ යුතු නීති රීති හඳුන්වා දී තිබුණි. ඒ අනුව රජය ආර්ථික කටයුතු මෙහෙයවන අංශ 08 ක් යටතේ ව්‍යාපෘති 322 කින් සියයට 50

ක් පමණක් මූලික අනුමැතීන් ලබාගෙන තිබූ අතර සියයට 19 ක් පමණ දෙවන අනුමැතීන් ලබාගෙන තිබුණි. 2030 න්‍යාය පත්‍රය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන හා මූල්‍ය සැලසුම් සමග තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක එකට පෙළගැස්වීමේ අවශ්‍යතාවක් මතු වී ඇත. 2018 ජාතික අයවැය ලේඛනයෙන් ප්‍රධාන ව්‍යාපෘති සමග ඉලක්ක 78 ක් හා 2019 ජාතික අයවැය ලේඛනයෙන් ප්‍රධාන ව්‍යාපෘති සමග ඉලක්ක 75 ක් තිරසර සංවර්ධන අරමුණු සඳහා වෙන්කර තිබුණි. තවද, තිරසර සංවර්ධනය ඉලක්ක කරගෙන ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රමෝපායක් පිළියෙල නොකිරීම, සියළු පාර්ශව නියෝජනය වන ආකාරයට (Disaggregation) දත්ත නොමැති වීම, ආයතන මට්ටමින් කාර්යසාධන දර්ශක සෑම අමාත්‍යාංශයක්ම 2018 වර්ෂයේ සිට පිළියෙල කර තිබුණත් අදාළ අමාත්‍යාංශ හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඒවා ජාතික වශයෙන් මැනීමක් සිදු නොවීම, තිරසර සංවර්ධන පනතට අනුව ජාතික ප්‍රතිපත්තියට හා උපායමාර්ගයට අනුකූලව රාජ්‍ය ආයතන තම විෂයපථයට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් තිරසර සංවර්ධන උපායමාර්ග සකස්කර ඒවා තිරසර සංවර්ධන සභාව වෙත ලබාදී නොතිබීම, 2025 දැක්මෙහි එක් ඉලක්කයක් කරා ළඟා වීම පිළිබඳව බලාපොරොත්තු තැබිය හැකි වුවත්, ඉතිරි ඉලක්ක තුන කරා ළඟා වීමට ශ්‍රී ලංකාවට දැඩි පරිශ්‍රමයක් දැරිය යුතු වීම තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට පත්කළ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව 2018 නොවැම්බර් මස 20 වෙනි දින සිට ක්‍රියාත්මක නොවීම යන කරුණු මෙහිදී ප්‍රධාන නිරීක්ෂණයන් විය.

තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා ආර්ථික, සාමාජීය හා පාරිසරික යන පැතිකඩයන් 03 සමතුලිත විය යුතුය. මූල්‍ය සැලසුම් යටතේ අයවැය යෝජනා අනුව පාරිසරික ව්‍යාපෘති වෙනුවෙන් 2018 වර්ෂයේ ව්‍යාපෘති 17 ක් හා 2019 වර්ෂයේ ව්‍යාපෘති 17 ක් සඳහා අරමුදල් වෙන්කර තිබුණි. ශ්‍රී ලංකාව පාරිසරික කාර්යසාධන දර්ශකයේ 2018 වර්ෂයේ 60 වන ස්ථානයට පත්වී ඇති අතර එය 2020 වර්ෂයේදී 25 වෙනි ස්ථානය දක්වා ගෙන ඒමට රාජ්‍ය ආයෝජන වැඩසටහනේ (2017-2020) ඉලක්කර කර තිබුණි. නමුත් එම තත්ත්වයට ළඟා වීම පිළිබඳව රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ක්‍රියාත්මක කළ වැඩසටහන් ඇගයීමේදී වන ගහණය 2015 වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබීම, කොළඹ නගරයේ වායු තත්ත්වය ලෝක සෞඛ්‍ය සංවිධාන (WHO) ප්‍රමිත ඉක්මවා යාමට ආසන්න වෙමින් පැවතීම , අලිමිනිස් ගැටුම වර්ධනය වීම, ලෝක කාලගුණ අවදානම් දර්ශකයේ ශ්‍රී ලංකාව දෙවන ස්ථානයට පත්වීම යන කරුණු අනුව පාරිසරික සමතුලිතතාව රැකගැනීමට ශ්‍රී ලංකාවේ සූදානම පිළිබඳ ගැටලු පැන නැගී ඇත.

ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කරවීමේ මූලික වගකීම් දරන ආයතනවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේදී, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය 2019 නොවැම්බර් දක්වා තිරසර සංවර්ධන ඉලක්ක යටතේ සිදුකරන ව්‍යාපෘතිවල වල ප්‍රගතිය මැනීම සඳහා දත්ත පද්ධතියකට ඇතුලත් කරමින් පැවතීම හේතුවෙන් ප්‍රගතිය මැනීමට නොහැකි වීම, මධ්‍යම

පරිසර අධිකාරියේ 2019 වර්ෂයට අදාල දත්ත අනුව නාගරික ඝන අපද්‍රව්‍ය වලින් සියයට 84 ක් නිසි පරිදි අපහරණයට ලක් නොවීම, ජාතික ප්‍රතිචක්‍රීකරණ අනුපාතය සියයට 5 ක් වීම, ඒක පුද්ගල උපද්‍රවකාරී අපද්‍රව්‍ය ජනනය 2018 සිට 2019 දක්වා කි.ග්‍රෑම් 9.5 සිට කි.ග්‍රෑම් 13 දක්වා වැඩිවීම, පිළියම් කරන උපද්‍රවකාරී අපද්‍රව්‍ය අනුපාතය අඩුවීම, දහනය කරනු ලබන සායනික අපද්‍රව්‍ය ප්‍රතිශතය අඩුවීම, ප්‍රතිචක්‍රීකරණය සඳහා අපනයනය කරන ඉලෙක්ට්‍රොනික් අපනයන ප්‍රතිශතය පමණක් වැඩිවීම යන කාර්යසාධන තොරතුරු මෙහිදී ප්‍රධාන තැනක් ගැනුණි.

කිසිවකු අත්නොහැරීම යන තේමාව තිරසර සංවර්ධනයේ දී ඉතා වැදගත් සංකල්පයක් වන අතර එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත මගින්, සියලුම පුද්ගලයන්ට අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් නොමිලේ සැපයීමෙන් හා සමාජ ආරක්ෂණ ක්‍රම මගින් තහවුරු කිරීමට කටයුතු කර තිබුණි. ශ්‍රී ලාංකික ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ අනුව මානව සංවර්ධන දර්ශකය පෙර වර්ෂවලට සාපේක්ෂව 2018 වර්ෂයේදී ඉහල අගයක් ගෙන තිබුණි. 2018 වර්ෂයේ ජාතික අයවැය ඇස්තමේන්තු යටතේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ව්‍යාපෘති වෙනුවෙන් චක්‍රලේඛයක් නිකුත් කර තිබූ අතර ඒ සඳහා ඉලක්ක 14 ක් යටතේ ව්‍යාපෘති ඉදිරිපත් කර තිබුණි. නමුත් 2019 වර්ෂයේ ඒ සඳහා චක්‍රලේඛ නිකුත් කර නොතිබුණි. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අනුව අදාල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධව ඉලක්ක 14 ක් සඳහා දර්ශක සකස් කර තිබුණත් අදාල දත්ත සියලු පාර්ශවයන් නියෝජනය වන ආකාරයට දක්වා තිබුණේ ඉලක්ක 9 ක් සඳහා පමණි. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධව 2001 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කරන ලද සංගණනයේදී පාදවල ආබාධ වලින් පෙලෙන හා අධ්‍යාපනයක් නොලබන පිරිස වැඩි ප්‍රතිශතයක් ගන්නා බවත් ඔවුන්ගෙන් සියයට 73 ක් පමණ තම ඥාතීන් රැකබලා ගන්නා බවත් වාර්තා කර තිබුණි.

තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් ලබා ගැනීමේ වර්තමාන ක්‍රමෝපාය වන්නේ ජාතික අයවැය ලේඛනය මගින් අරමුදල් ලබා ගැනීමයි. එහිදී 2018 ජාතික අයවැය ලේඛනයෙන් (ණය ගෙවීම් අඩුකර) අරමුදල් සියයට 14 ක් ප්‍රධාන ව්‍යාපෘති හා ඉලක්ක සමග සම්බන්ධ කර තිබුණි. 2019 ජාතික අයවැය ලේඛනයෙන් (ණය ගෙවීම් අඩුකර) අරමුදල් සියයට 17 ක් ප්‍රධාන ව්‍යාපෘති හා ඉලක්ක සමග සම්බන්ධ කර තිබුණි. නමුත් මෑත කාලීන ආදායම් විශ්ලේෂණයේදී රාජ්‍ය ආදායම් ඉක්මවා රාජ්‍ය වියදම පැවතීම, අපනයන ආදායම ඉක්මවා ආනයන වියදම පැවතීම, ගෙවුම් ශේෂ හිඟය, රුපියල අව ප්‍රමාණය වීම, රාජ්‍ය ණය වැඩිවීම, අයවැය හිඟය නිසා අවශ්‍ය මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම දැඩි අවශ්‍යතාවයක් වී තිබුණි. ධාරිතා වර්ධනයේදි ශ්‍රී ලංකා රැකියා වෙළඳපල තුල

රජයේ විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගෙන් විද්‍යා, ගණිත, තාක්ෂණ උපාධිධාරීන් සංඛ්‍යාව මෑත කාලීන වර්ෂවල සාමාන්‍ය සියයට 28 ක් පමණක් වීම දැඩි අභියෝගයක් ලෙස පවතී.

ශ්‍රී ලංකාව සහශ්‍ර සංවර්ධන අරමුණු කරා ළඟා වූ ආකාරය (2000-2015) හා 2015 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම මැනීම සඳහා දර්ශක හා පාදක දත්ත තිබිය යුතුය. මේ සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉලක්ක 169 න් 49 ක් සඳහා දර්ශක හා පාදක දත්ත සකස් කර ඇති අතර ඉලක්ක 26 ක් සඳහා දර්ශක හා පාදක දත්ත සකස් කරමින් පවතී. අනෙකුත් ආයතන සකස් කළයුතු දර්ශක 131 සඳහා අදාළ ආයතන සතුව පෞද්ගලික දත්ත පැවතුනත් ඒවා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමග එකඟ වී ජාතික දත්ත පද්ධතියට ඒකාබද්ධ කර නොතිබුණි. තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පරීක්ෂාව සඳහා රාජ්‍ය ආයතන කාර්යසාධන දර්ශක (KPI) සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවා ඇති නමුත් අදාළ ආයතන හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් එම දර්ශක වල ප්‍රගතිය මැනීමක් 2019 වර්ෂය දක්වා සිදු කර නොතිබුණි. 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය නියාමනය , පසු විපරම, සමාලෝචනය හා වාර්තාකරණය සඳහා යාන්ත්‍රණය සකස් කිරීමට නෛතික ප්‍රතිපාදන සළසා තිබුණි. මෙම කාර්යය සඳහා ඩිජිටල් දත්ත පද්ධතියක් සකස් කිරීම, දත්ත පාලන ක්‍රමවේදයක් සැකසීම ක්‍රියාත්මක වෙමින් පවතී. තිරසර සංවර්ධන අරමුණු 17 හි ඉලක්ක 169 ට අනුව හා INTOSAI ප්‍රමිත 5130 හි 2.22 අනුව ශ්‍රී ලංකාවේ දැනට පවත්නා ප්‍රගතිය ජාත්‍යන්තරයට වාර්තාකරණය කළ යුතුය. 2018 වර්ෂයේදී තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ස්වේච්ඡා ජාතික සමාලෝචනය මඟින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු වල ප්‍රගතිය එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කර තිබුණි. එහිදී හඳුනාගත් අඩුපාඩු වනුයේ දිළිඳුකම පිටුදැකීමේ ජාත්‍යන්තර දරිද්‍රතා දර්ශකයෙන් පහළ සිටින ජනගහනය හා ජාතික දරිද්‍රතා අනුපාතය අඩු වුවත් ප්‍රාදේශීය විෂමතා පැවතීම, ස්වභාවික ආපදා නිසා දිළිඳුබව වැඩිවීම, ආර්ථිකයේ කාර්මික අංශයේ දායකත්වය අඩුවීම, බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩිවීම, පානීය ජලයේ ගුණත්වය අඩු වීමෙන් වකුගඩු රෝග ඇතිවීම, පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය අඩුවීම, අධ්‍යාපනය නොලබන, රැකියා නොකරන, පුහුණුවීම් නොලබන තරුණ ජනගහණයේ ප්‍රතිශතය සියයට 26 ක් වීම, සංවර්ධන ආධාර හා සෘජු විදේශ ආයෝජන අඩුවීම ජගත් ආයතනයන්හි ශ්‍රී ලංකා නියෝජනය අඩුවීම ගැටලු ලෙස වාර්තා කර තිබුණි. තිරසර සංවර්ධන අරමුණු 17 හි ප්‍රගතිය මහජනතාවට, විධායකයට හා පාර්ලිමේන්තුවට දැනගැනීම සඳහා ලබාදීමට ක්‍රමවේදයක් 2019 දෙසැම්බර් දක්වා සකස් කර නොතිබුණු අතර ඒ පිළිබඳ අවධානය යොමු කරමින් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පහත සඳහන් නිර්දේශයන් කරනු ලැබේ.

i. රජයේ ආයතන ඔවුන්ගේ විෂයපථයන්ට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු හා උපක්‍රමය පිළියෙල කිරීමට අදාළ තොරතුරු තිරසර සංවර්ධන සභාවට ලබාදීමෙන් තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය හා උපක්‍රමය පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

ii. ජාතික අයවැය ලේඛනය මගින් දක්වා ඇති කාර්යසාධන දර්ශක (KPI) අදාල ආයතන සමග සම්බන්ධ වී මැනීමේ ක්‍රමයක් සංවර්ධනය කිරීම.

iii. ජාතික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයේදී 2019 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන සෞභාග්‍යයේ දැක්ම තුළ, තිරසර සංවර්ධන ජාතික සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ නැවත සකස් කිරීම පිළිබඳව තිරසර සංවර්ධන සභාව විසින් නියාමනය කිරීම.

iv. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා පාරිසරික පැතිකඩ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

v. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමේදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට ලබාදෙන සුබසාධන පහසුකම් වැඩිකිරීම

vi. ඉලක්ක සපුරාගැනීම සඳහා සම්පත් ඉල්ලා සිටීමට පහසු වනු පිණිස රාජ්‍ය ආයතනවලට පැහැදිලි ලෙස චක්‍රලේඛ නිකුත් කිරීම.

vii. රජයේ ආයතන විසින් පිළියෙල කළ යුතු දර්ශක 131 පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම, පුහුණුව ලබාදීම හා ඒ පිළිබඳ පසු විපරම් කිරීම.

viii. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු දර්ශක 26 පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

ix. තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාවේ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රජයේ ආයතනවල සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම.

x. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ සමස්ථ ප්‍රගතිය නියාමනය හා ඇගයීමට හැකි ලෙස නියාමන හා ඇගයීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.

xi. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය කාලීනව වාර්තා කිරීමේ ක්‍රමයක් සකස් කිරීම හා ඒවා මහජනතාවට හා ඒ සම්බන්ධයෙන් ඇල්මක් දක්වන පාර්ශවයන්ට ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම

2015 ප්‍රංශයේ පැරිස් නුවරදී තිරසර සංවර්ධන අරමුණු 17 ක් හා ඉලක්ක 169 ක් අනුව යමින් ලෝකය සුරක්ෂිත කිරීමට රාජ්‍ය නායකයන් විසින් ගිවිසගෙන තිබුණි. එම ගිවිසුමට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති හෙයින් මෙම තිරසර සංවර්ධන අරමුණු හා යමින් එම ඉලක්ක ජයගැනීම සඳහා කටයුතු කිරීමට රජය බැඳී ඇත. ගෝලීය උණුසුම ඉහළයාම නිසා දේශගුණික විපර්යාසවල කොටස්කරුවන් වීමට අපටද සිදුව ඇති බව බොහෝ දෙනා නොදනී. සාමාජික රටවල් විසින් ලෝකයේ පැවැත්ම සහතික කරලනු වස් තම රට තුල සංවර්ධන සැලැස්ම තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක අනුව ගලපා ගත යුතුව ඇත. නැතහොත් තම රට තුල තම ප්‍රධාන සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේදී මෙම තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මාර්ගෝපදේශ කර ගත යුතුව ඇත.

අපි කාර්මික යුගයේ අවසානයට පැමිණ ඇත්තෙමු. එළැඹෙමින් පවතිනුයේ තිරසර යුගයකි. 2030 දී එළැඹෙන්නේ තිරසර යුගයයි. එබැවින් අපි මේ පසු කරමින් සිටින්නේ කාර්මික යුගයේ සිට තිරසර යුගය දක්වා මිනිසා රැගෙන යන සංක්‍රමණික අවධියයි. 2030 දී තිරසර යුගය එළැඹෙන බව සහතික කිරීම උදෙසා ලෝක ප්‍රජාව යොදා ගත් වැඩ පිළිවෙල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක නම් වේ.

එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවද, පියවරයන් ගණනාවක් ගනිමින් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට එළඹ සිටී. තිරසර සංවර්ධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කිරීම සහ 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත නීතිගත කිරීම වැනි උත්සාහයන් එම පියවරයන් අතර වේ. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට අදාළ අමාත්‍යාංශ සමඟ පාර්ලිමේන්තුවේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කාර්යය හා විශේෂඥ උපදෙස් ලබාදීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටුවා තිබුණි. මහවැලි සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යයයේදී සම්බන්ධීකරණය, සහසුකම් සැලසිම හා වාර්තාකරණය යන කාර්යයන් 2018 දෙසැම්බර් 10 දින දක්වා කර තිබුණි. 2019 වර්ෂයේ දෙසැම්බර් 10 දින අංක 2153/12 දරණ ගැසට් පත්‍රය අනුව තිරසර සංවර්ධන සභාව මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතී. තිරසර සංවර්ධන පනතේ පළමුවැනි කොටසේ 3 වගන්තිය ප්‍රකාරව, තිරසර සංවර්ධන සභාව ස්ථාපිත කරන ලද අතර, ඒ සඳහා සාමාජිකයන් 2018 පෙබරවාරි මාසයේදි පත් කර තිබුණි.

## 2.2 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාරව හා ජාතික විගණන පනතේ 3(1)(ඈ), 5(2) , 12(උ) වගන්ති අනුව මාගේ විධානය යටතේ මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදී.

## 2.3 මාතෘකාව තෝරා ගැනීමට හේතුව

"අපගේ විශ්වය වෙනස් කිරීම" (Transforming our world) නම් වූ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය පිළිපැදීම සඳහා ශ්‍රී ලංකාවද එහි සාමාජික රටක් ලෙස බැඳී සිටි. රජය විසින් මෙම වගකීම ඉටු කිරීම සම්බන්ධයෙන් දරනු ලබන ප්‍රයත්නය සඳහා සමාලෝචනය හා පසු විපරම තුළින් දායකත්වය සැපයීමේ අවශ්‍යතාවයද, උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනවල තිරසර සංවර්ධනය සම්බන්ධ කාර්යභාරය සඳහන් කර තිබෙන INTOSAI ප්‍රමිත අංක 5130 අනුවද, ස්වාධීන සමාලෝචනයක අවශ්‍යතාවය අවධාරණය කර තිබීමද විගණනය සඳහා මෙම මාතෘකාව තෝරා ගැනීමට හේතුවිය.

## 2.4 විගණන ප්‍රවේශය

මෙහිදී යොදා ගනු ලැබුවේ පද්ධති, ප්‍රතිඵල සහ ප්‍රශ්න පාදක ඒකාබද්ධ ප්‍රවේශයකි.

## 2.5 විගණන අරමුණු

විගණන දෘෂ්ටියෙන් බලන කල ප්‍රධාන අරමුණු තුනක් හඳුනාගත හැකිය.

i රජය කුමන ප්‍රමාණයකට 2030 න්‍යාය පත්‍රය එහි ජාතික සන්දර්භයට යොදාගෙන තිබේද යන්න.

ii 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් රජය විසින් හඳුනාගෙන ඒවා සුරක්ෂිත කොට තිබේද යන්න.

iii රජය විසින් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව නියාමනයට, පසු විපරමට, සමාලෝචනයට හා වාර්තා කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපනය කර තිබේද යන්න.

## 2.6 විගණන නිර්නායක

එක් එක් විගණන අරමුණ සාක්ෂාත් කරගැනීම තක්සේරු කිරීම සඳහා සංවර්ධනය කළ විගණන නිර්නායක පහත දැක්වේ.

i. රජය තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කරන වගකිව යුතු ආස්ථිතායන් රජය විසින් හඳුනාගැනීම අවශ්‍ය වීම.
ii. රජය විසින් ස්ථාපිත කරන ලද තිරසර සංවර්ධන සභාව තිරසර ජාතික ප්‍රතිපත්තිය හා උපක්‍රමය සකස් කිරීම අවශ්‍ය වීම.
iii. 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට පවත්නා ආයතනික සූදානම පිළිබඳව රජය විශ්ලේෂණයක් කිරීම අවශ්‍ය වීම.
iv. වගකිව යුතු ආස්ථිතායන්වල කාර්යයන් හා ප්‍රධාන අරමුණු රජය විසින් හඳුනාගැනිම අවශ්‍ය වීම.
v. රජය ජාතික සංවර්ධන සැලැස්ම සහ එයට අදාළ ආංශික සැලැසුම් දියුණු කිරීමේ ක්ෂේත්‍ර රජය විසින් හඳුනාගැනීම අවශ්‍ය වීම.
vi. තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව මහජනයා දැනුවත් කිරීම අවශ්‍ය වීම.
vii. 2030 න්‍යාය පත්‍රය ක්රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම විවිධ සාන්ද්‍රික ප්‍රජාව යොදවා ගැනීම
viii. ක්‍රියාත්මක ක්‍රියාවලියට අදාළ රාජ්‍ය ආස්ථිතාවල භූමිකාවන් හා වගකීම් පැහැදිලිව හඳුනා ගැනීම.
ix. විවිධ මට්ටම් අතර පවතින සම්බන්ධීකරණ යාන්ත්‍රණය, සමාලෝචනය හා වෙනස්කම් අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
x. එක් එක් පරිපාලන මට්ටම අතර තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් පැවරීමට ආයතනික සැළසුම් පිළියෙල කිරීම.
xi. තිරසර සංවර්ධනයේ පැතිකඩයන් ත්‍රිත්වය ඒකාබද්ධ කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති තිබීම.
xii. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් හඳුනා ගැනීම.
xiii. සම්පත් හා ධාරිතාවන් හඳුනා ගැනීමේදී සියල්ල ඇතුළත් ක්‍රියාවලියක් තිබීම.
xiv. අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් ලබාගැනීමේදී වගකිව යුතු ආස්ථිතායන් එකිනෙක අතර සහයෝගය සංවර්ධනය කිරීම අවශ්‍ය වීම.

xv. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා නියාමනයට හා වාර්තා කිරීමට ජාතික වශයෙන් අදාළ දර්ශක හා පාදක දත්තවල අවශ්‍යතාවය

xvi. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම නියාමනය හා ප්‍රගතිය වාර්තා කිරීමට කඩඉම් තිබිය යුතු වීම (milestones)

xvii. අවශ්‍ය වූ සියලු පාර්ශවයන් නියෝජනය වන දත්ත එකතු කිරීමේ පද්ධතියක අවශ්‍යතාවය

xviii. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම හා වාර්තා කිරීමේ පද්ධතියක අවශ්‍යතාවය

## 2.7 විගණන නිර්ණායක ප්‍රභවයන්

නිර්නායක ප්‍රභවයන් පහත පරිදි වේ.

i. තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2015 ඔක්තෝබර් මස 07 වෙනි දින අතුරු විස්තරාත්මක මාර්ගෝපදේශය

ii. උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනයේ තිරසර සංවර්ධන අරමුණු විගණනය සම්බන්ධව උත්තරීතර විගණන ආයතන කාර්යභාරය සඳහා වන 5130 දරන ප්‍රමිතිය

iii. 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන

iv. අන්තර් පාර්ලිමේන්තු සංගමය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සකස් කරන ලද ස්වයං තක්සේරු මෙවලම් කට්ටලය (Self Assessment Tool Kit)

v. එක්සත්ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සකස් කළ ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ඒකාබද්ධ තක්සේරු වාර්තාව

vi. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් සකස් කළ තිරසර සංවර්ධන අරමුණු රාජ්‍ය ආයෝජන සැලැස්ම සමඟ කළ තක්සේරුව, 2019 වර්ෂයේ නව ව්‍යාපෘති ඇගයීමේ මාර්ගෝපදේශය

vii. 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත

viii. සහශ්‍ර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකා වාර්තාව

ix. ස්වේච්ඡා ජාතික සමාලෝචනය 2018

x. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක තත්ත්වය පිළිබඳ වාර්තාව

xi. 2025 දැක්ම හා 2019 සෞභාග්‍යයේ දැක්ම

xii. 2019 සැප්තැම්බර් 18 වෙනි දින අංක අමප/19/2488/101/159 දරන අමාත්‍ය මණ්ඩල තීරණය

xiii. 2018 අප්‍රේල් මස 19 වෙනි දින අංක 18/0593/708/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය

xiv. තිරසර සංවර්ධන අරමුණු හා සම්බන්ධ චක්‍රලේඛ

- 2017 ජූලි 25 දිනැති අංක 2/2017 දරන අයවැය චක්‍රලේඛය
- 2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන අයවැය චක්‍රලේඛය
- 2018 ජූලි 31 දිනැති අංක බීඩී/සීබීපී/4/1/2 දරන අයවැය චක්‍රලේඛය
- 2019 ඔක්තෝබර් 03 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/ඩී/22/2019 දරන තිරසර සංවර්ධන සභාවේ චක්‍රලේඛය

xv. තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට මූලික වගකීම දරන ආයතන වන කාර්යසාධන වාර්තා

## 2.8 ක්‍රමවේදය

විවිධ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා යොදාගත හැකි විවිධ වූ ක්‍රමවේදයන් පහත දැක්වේ.

| **දත්ත වර්ගය** | **සාක්ෂි ලබාගත් ක්‍රමවේදය** |
|---|---|
| ------ | --------------------------- |
| i. ලිඛිතමය දත්ත | අදාළ ලියකියවිලි සමාලෝචනය, ලිපිගොනු පරීක්ෂාව |
| ii. අනුග්‍රාහාත්මක දත්ත | රජයේ නිලධාරීන්, සාන්ද්‍රික ප්‍රජාව, ඉලක්ක කණ්ඩායම් සමඟ සම්මුඛ සාකච්ඡා |
| iii. විග්‍රාහාත්මක දත්ත | ශ්‍රී ලංකා මහ බැංකුව, අයවැය ඇස්තමේන්තු, විගණක විසින් නිර්මාණය කරන ලද විවිධ වර්ගයේ දත්ත |

## 2.9 විගණන ප්‍රමිත වලට අදාල වීම

ඉතා උසස් ගුණාත්මක විගණන වාර්තාවක් ලබාදීම සඳහා උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ප්‍රමිත භාවිතා කරන ලදී. එනම්, ISSAI 300, ISSAI 3000, ISSAI 3100, ISSAI 3200

## 2.10 විගණන විෂය පථය

2018 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුලදී තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව 2019 අංක 19 දරන තිරසර සංවර්ධන පනත යටතේ ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා ඇති තිරසර සංවර්ධන සභාව හා එම සභාව සමග සම්බන්ධ කර තිබූ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය හා දැනට සම්බන්ධ කර තිබෙන මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, අරමුදල් සම්පාදනයේදී දායකත්වය ලබාදෙන ජාතික අයවැය දෙපාර්තමේන්තුව, තිරසර සංවර්ධන අරමුණු මැනීම සඳහා දර්ශක සකස් කර තිබෙන ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යයට ජාතික වශයෙන් වගකීමක් දරන තෝරාගත් රාජ්‍ය ආයතන වල තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම පරීක්ෂා කරන ලදී.

## 2.11 තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සාන්ද්‍රික ප්‍රජාවගේ සහභාගීත්වය

දැක්ම, තිරසර සංවර්ධන සභාව, පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව හා එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් කෙරෙන දායකත්වය විස්තර කර එය රටේ ජාතික තලය හා උප ජාතික තලය වශයෙන් ස්ථර දෙකක් යටතේ ක්‍රියාත්මක වන ආකාරය රූප සටහනේ දක්වා ඇත.



## 3. විස්තරාත්මක විගණන සොයාගැනීම්

### 3.1 2030 න්‍යාය පත්‍රය ජාතික සන්දර්භයට ඒකාබද්ධ කිරීම

#### 3.1.1 තිරසර සංවර්ධනය සම්බන්ධව ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය සැකසීම

**(අ) උපාය මාර්ග සැකසීම**

වසර 2015 දී ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වන 2030 න්‍යාය පත්‍රය අනුව සංවර්ධන ක්‍රියාවලිය තිරසර සංවර්ධන මාවතකට යොමු කිරීම සඳහා විශිෂ්ට අවස්ථාවක් උදා කරගෙන තිබේ. 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත මගින් පිහිට වූ තිරසර සංවර්ධන සභාව එහි සාමාජිකයන් 2018 වර්ෂයේ පෙබරවාරි පත්කර තිබුණි. තිරසර සංවර්ධන පනතේ පලමුවන කොටසේ 10 වන වගන්තිය ප්‍රකාරව තිරසර සංවර්ධන සභාවේ බලතල හා කාර්යයන් නියම කර ඇත. ඒ අනුව තිරසර සංවර්ධන සභාව විසින් ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය හා උපක්‍රමය සැකසීම, පනතේ 12(1) වගන්තිය අනුව අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක්, පළාත් දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන ආයතනයක් විසින්ම තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට හා උපාය මාර්ගවලට අනුව ස්වකීය විෂයය පථයට අදාල උපාය මාර්ග සකස් කර ගත යුතුය.

**(ආ) උපාය මාර්ග සකස් කර තිරසර සංවර්ධන සභාවට ඉදිරිපත් කිරීම**

2019 සැප්තැම්බර් 18 වෙනි දින අංක 19/2488/101/159 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය හා උපක්‍රමය සකස් කළ යුතු ආකාරය පිළිබඳ විස්තර දක්වා තිබුණි. සෑම රජයේ ආයතනයක්ම හදුනාගත් උපක්‍රම යටතේ වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනාගැනීම හා තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය අමාත්‍ය මණ්ඩලය හා පාර්ලිමේන්තුව අනුමත කළ පසු, එය වසර 2020 – 2030 කාලපරිච්ඡේදය සඳහා වන ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය පිළිබඳ ඉහළ මට්ටමේ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය බවට පත්වේ. එම ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ගය අනුව රටෙහි සංවර්ධන වැඩ සටහන් හා ක්‍රියාකාරකම් පෙළගැස්වීම කළ යුතුයි. එහිදී තිරසර සංවර්ධන සභාවට ඒ සඳහා යම් නිශ්චිත කරුණක් ගැන අධ්‍යයනය සඳහා විශේෂඥ කමිටු පත්කිරීම සඳහා ලැබී ඇති බලය අනුව තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ කාර්යය ප්‍රජාතාන්ත්‍රවාදී යහපාලනය හා වගකීම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියට (SDGAP) ලබා දී ඇත. මේ සඳහා නියාමන කමිටුවක් හා උපදේශකයෙකු තිරසර සංවර්ධන සභාව විසින් පත්කර ඇත. ඒ අනුව තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය සකස් කර එහි පළමු කෙටුම්පත තිරසර සංවර්ධන සභාවට භාර දී තිබුණත් තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය 2019 නොවැම්බර් මාසය දක්වා පිළියෙල කර නොතිබුණි.

### 3.1.2 තිරසර සංවර්ධනයට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම

**(අ) ජාතික ප්‍රතිපත්තිය හා උපක්‍රමය නොමැතිවීමේ බලපෑම**

සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් තම විෂය පථයට අදාළව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපක්‍රමය අනුකූලව, තිරසර සංවර්ධන උපක්‍රමය පිළියෙල කළ යුතු බව 2017 අංක 19 දරන ජාතික තිරසර සංවර්ධන පනතේ 11 වගන්තියේ දක්වා ඇත. කෙසේ වෙතත්, තිරසර සංවර්ධනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් හා උපක්‍රමයක් නොමැති වීම හේතුකොට ගෙන අදාළ ආයතන ඔවුන්ගේ වර්තමාන ක්‍රියාකාරී සැලැස්ම හරහා තිරසර සංවර්ධන අරමුණු මත ඔවුන්ගේ කාර්යයන් කරගෙන යනු ලැබේ. ඒ සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු 2015 වර්ෂයේ සිට සිදුකරනු ලැබුවේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අංශය මගිනි.

**(ආ) විෂය පථයට ගැලපෙන අයුරින් ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම**

i. 2018 අප්‍රේල් 19 වෙනි දින අංක 18/0593/708/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය ආයතන තම විෂය පථයට අනුව තිරසර සංවර්ධන අරමුණු හා ගැලපෙන ආකාරයට තම ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කළ යුතු බව තිරසර සංවර්ධන හා වනජීවී හා අමාත්‍යාංශයේ 2018 අප්‍රේල් මස 27 වෙනි දින අංක එම්එස්ඩීඩබ්ලිව්/08/65 දරන ලිපිය ප්‍රකාරව දක්වා ඇත.

ii. 2019 ඔක්තෝබර් 03 වෙනි දින අංක පීඑස්/එස්පී/එස්බී/සී/22/2019 දරන තිරසර සංවර්ධන සභාවේ සභාපතිගේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන පනතට අනුව ජාතික ප්‍රතිපත්තියට සහ උපායමාර්ගයට අනුකූලව ක්‍රියාකිරීම සෑම අමාත්‍යාශයක, දෙපාර්තමේන්තුවක, පළාත් සභාවක, පළාත් අමාත්‍යාංශයක, පළාත් දෙපාර්තමේන්තුවක හා පළාත් පාලන ආයතනයකම වගකීම වන අතර, ස්වකීය විෂයපථයට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් තිරසර සංවර්ධන උපායමාර්ග සකස්කල යුතුව ඇත. ඒ සඳහා 2019 අගෝස්තු හා සැප්තැම්බර් මාසවල සෑම රාජ්‍ය ආයතනයකම නිලධාරීන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩමුළු පවත්වා තිබුණි. නමුත් 2019 නොවැම්බර් දක්වා රජයේ කිසිදු ආයතනයක් විසින් තම විෂය පථය අනුව තිරසර සංවර්ධන උපායමාර්ග සකස් කර ඒවා තිරසර සංවර්ධන සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන සභාවේ කාර්යයන් ඉටු කිරීම**

තිරසර සංවර්ධන සභාවේ පහත සඳහන් කාර්යයන් 2019 නොවැම්බර් මාසය දක්වා ඉටු වී නොමැති බව තිරසර සංවර්ධන සභාව විසින් ලබාදී තිබූ ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

i. තිරසර සංවර්ධන ප්‍රමිති සහ පරිසර පිය සටහන් දර්ශක හඳුනාගැනීම;

ii. පර්යේෂණ හා සංවර්ධනය, නව සොයා ගැනීම්, අධ්‍යාපනය, දැනුවත්භාවය හා දිළිඳුකම පිටුදැකීම, ඇතුළුව තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

iii. තිරසර සංවර්ධනයට අදාළ යාන්ත්‍රණ, විගණන යාන්ත්‍රණ සහ වෙනත් සියලු කරුණු හඳුනාගෙන ඒවා අනුගමනය කිරීම;

### 3.1.3 තිරසර සංවර්ධන අරමුණු ජාතික සැලැසුම්, ප්‍රතිපත්ති වලට ඒකාබද්ධ කිරීම

**(අ) අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්කයන්**

i. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වූ දැක්මට 2019 වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා යොදා ගත්තේ 2025 දැක්ම වේ. ඒ අනුව, 2025 වනවිට ශ්‍රී ලංකාව දැනුම පදනම් කරගත් උසස් තරඟකාරී සමාජයීය අලෙවි ආර්ථිකයක් බවට පරිණාමය වෙමින්, ඉන්දියානු සාගරයේ කේන්ද්‍රීය පොහොසත් රටක් බවට පත්විය හැකිය. 2025 දැක්ම අනුව වාර්ෂික ඒකපුද්ගල දළ ජාතික ආදායම එ.ජ.ඩොලර් 5000 දක්වා ඉහළ නැංවීමටත්, රැකියා දශ ලක්ෂයක් බිහි කිරීමටත්, වර්ෂයක සෘජු විදේශ ආයෝජන එ.ජ.ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීමටත්, වර්ෂයක අපනයන වටිනාකම දෙගුණ කර එ.ජ.ඩොලර් බිලියන 20 ක් දක්වා වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ.

| | ඉලක්ක | 2017 | 2018 | ඉලක්ක 2025 |
|---|---|---|---|---|
| | --------- | ------ | -------- | --------------- |
| i. | වාර්ෂික ඒකපුද්ගල දළ ජාතික ආදායම ඒ.ජ. ඩොලර් 5000 ට ඉහල නැංවීම | එ.ජ.ඩො. 3,396 | එ.ජ.ඩො. 3,991 | එ.ජ.ඩො. 5000 |
| ii. | රැකියා දශ ලක්ෂයක් බිහි කිරීම | දත්ත නැත | දත්ත නැත | 1,000,000 |
| iii. | අපනයන වටිනාකම දෙගුණ කර එය ඒ.ජ. ඩොලර් බිලියන 20 දක්වා වැඩි කිරීම | අපනයන ඉපයීම් එ.ජ. ඩොලර් මිලියන 11,360 (බිලියන 11) | අපනයන ඉපයීම් එ.ජ. ඩොලර් මිලියන 11,889 (බිලියන 11) | අපනයන ඉපයීම් එ.ජ. ඩොලර් බිලියන 20 |
| iv. | සෘජු විදේශ ආයෝජන ඒ.ජ. ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීම | සෘජු විදේශ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 1,910 (බිලියන 1.9) | සෘජු විදේශ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 2,136 (බිලියන 2.1) | සෘජු විදේශ ආයෝජන එ.ජ. ඩොලර් බිලියන 5 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා**

ii. ඉහත දත්ත අනුව ඉහත ඉලක්කවලින් වාර්ෂික ඒක පුද්ගල දළ ජාතික ආදායම ඒ.ජ.ඩොලර් 5000 ඉලක්කයකට ලඟාවීමට හැකි බවට බලාපොරොත්තු තැබිය හැකි වුවත්, අපනයන ආදායම දෙගුණ කිරීමට හෝ සෘජු විදේශ ආයෝජන වැඩි කිරීම දුෂ්කර වී තිබෙන බව නිරීක්ෂණය විය. තවද මෙම 2025 දැක්මෙහි ඉලක්ක පාරිසරික පැතිකඩයන්ට වඩා ආර්ථික හා සාමාජීය පැතිකඩයන් සමග ඒකාබද්ධ වී ඇති බවද නිරීක්ෂණය විය. 2019 වර්ෂයේ නොවැම්බර් මාසයේ ඉදිරිපත් කරන ලද සෞභාග්‍යයේ දැක්ම තුළද, තිරසර සංවර්ධනය සඳහා 2030 වර්ෂයේදී ගමන් කිරීමට ජාතික සැලැස්මක් සකස් කිරීම හා ඒ අනුව කැබිනට් අමාත්‍යාංශ නැවත සකස් කරන බව දක්වා තිබුණි.

### 3.1.4 පාර්ලිමේන්තුවේ කාර්යයන්

**(අ) ප්‍රතිපත්ති හා නීති සම්පාදනය සහ අවශ්‍ය නිර්දේශ ලබාදීම**

පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට පහත සඳහන් කරුණු ගැන නිර්දේශ කිරීමටත්, අදාළ රේඛීය අමාත්‍යාංශ විමසමින් ජාතික ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීමටත් බලය පවරා තිබේ. ප්‍රමාණවත් දේශීය සම්පත් වෙන්කිරීම සහ ජාත්‍යන්තර අරමුදල් ප්‍රභවයන් සොයාගැනීම, රජයේ ක්‍රියාත්මක නියෝජිතායතන අතර සම්බන්ධීකරණය, ජාතික පළාත් සහ ප්‍රාදේශීය මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු ජාලගතව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැනීමට පියවර ගැනීම, රජයේ පුද්ගලික හවුල්කාරීත්ව දිරිමත් කිරීම, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හා සිවිල් සමාජ සංවිධානවල සහාය ලබාගැනීම, විශේෂඥ දැනුම හා පළපුරුද්ද දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් බෙදාගැනීම, වෙනම දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම හා කාලීනව ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ සියලුම කරුණු සලකා බැලීම යන සම්බන්ධිත කාර්යයන් ඇතුළත් වේ.

**(ආ) කාර්යභාරය ඉටු කිරීමේ ප්‍රගතිය**

වගකීම් කාර්යභාරය ඉටු කිරීම යටතේ සමාලෝචනය හා අධීක්ෂණය, උපදේශක සේවා සැපයීම්, නීති සම්පාදනය, සම්බන්ධීකරණය හා දැනුවත් කිරීම සහ වාර්තා සකස් කිරීම වශයෙන් වූ වගකීම් හඳුනාගෙන තිබුණු අතර, එම වගකීම් ඉටු කිරීම සඳහා පත්කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව 2018 නොවැම්බර් මස 20 වන දින සිට ක්‍රියාත්මක නොවීමෙන් වගකීම් 5 ක් යටතේ වූ කාර්යයන්ගෙන් කාර්යයන් 4 ක ප්‍රගතිය මැනීමට නොහැකි විය.

**(ඇ) තිරසර සංවර්ධන අරමුණු ප්‍රාදේශීයකරණය**

පොදු දැක්මක් කරා ජාතික ප්‍රතිපත්ති කේන්ද්‍රගත කිරීම හා සම්බන්ධීකරණය කිරීම කළ යුතුය. අන්තර් පාර්ලිමේන්තු සංගමය (IPU) හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් සකස් කරන ලද ස්වයං තක්සේරු මෙවලම් කට්ටලය මගින් උපාය මාර්ග, යාන්ත්‍රණය හා හවුල්කාරීත්වය හඳුනා ගෙන ඇත.

i. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව මඟින් ජාතික සංවර්ධන සැලැස්ම සඳහා පහසුකම් සැලැස්වීමෙහිලා තිරසර සංවර්ධන පරමාර්ථ ප්‍රාදේශීකරණය සඳහා ප්‍රාදේශීය වශයෙන් නිර්වචනය කරන ලද උචිත දර්ශකවල උපකාරය ලබා දිය යුතු අතර පුරවැසියන් මෙම ක්‍රියාවලියට සමීප කරගත යුතුය.

ii. ස්වයං තක්සේරු කට්ටලය අනුව විශේෂිත ප්‍රාදේශීය අවශ්‍යතා හඳුනාගැනීම පාර්ලිමේන්තුව මගින් කළ යුතුය.

iii. ජනතාව නියෝජනය කිරීම සඳහා තිරසර සංවර්ධන අරමුණු ප්‍රාදේශීයකරණය සඳහා වූ ඉහළම මණ්ඩලයක් පාර්ලිමේන්තුව තුළ සිටිය යුතුය.

iv. තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීමේ ප්‍රගතිය ස්වයං තක්සේරු මෙවලම් කට්ටලයක් මඟින් මැනීම, ජාතික හා ප්‍රාදේශීය අවශ්‍යතා අනුව අවධානයට යොමුවිය යුතු කණ්ඩායම්වල තත්ත්වයක් පිළිඹිබු වන බවට වගබලා ගැනීමේ වගකීම අදාළ රටේ පාර්ලිමේන්තුව වෙත පැවරේ.

**(ඇ) පාර්ලිමේන්තුව විසින් ලබා දී ඇති පිළිතුරු අනුව ප්‍රගතිය**

ජනතාවගේ අවශ්‍යතා සපුරා ගනු පිණිස පාර්ලිමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම සඳහා ස්වයං තක්සේරු මෙවලම් කට්ටලය මඟින් ලබා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිලිතුරු අනුව පාර්ලිමේන්තුවෙන් පහත සඳහන් කාර්යයන් ඉටු වී නොමැති බව වාර්තා කර තිබුණි.

i. රජයේ ආයතනවල තිරසර සංවර්ධන අරමුණු සඳහා දර්ශක හා පාදක දත්ත සකස් කිරීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදයක් නොතිබීම.

ii. ජාතික අයවැය තුල තිරසර සංවර්ධන අරමුණු සඳහා ප්‍රමාණවත් මුදල් වෙන්කර තිබේද යන්න පරීක්ෂාවට ක්‍රමවේදයක් නොතිබීම.

iii. තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර හා පෞද්ගලික අංශයේ දායකත්වය වාර්තාගත කිරීමේ හා ඇගයීමේ ක්‍රමවේදයක් නොතිබීම.

iv. 2018 නොවැම්බර් මස 20 වෙනි දින සිට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ක්‍රියාත්මක නොවන නිසා යාවත්කාලීන තොරතුරු පාර්ලිමේන්තුව සතු නොවීම.

### 3.1.5 සීඝ්‍ර ඒකාබද්ධ තක්සේරුව

තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ජාතික සංවර්ධන සැලැස්ම පෙළගැස්වීම හා මට්ටම හඳුනාගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් රාජ්‍ය ආයෝජන වැඩසටහන සැලකිල්ලට ගනිමින් " සීඝ්‍ර ඒකාබද්ධ තක්සේරුව" නමින් (Rapid Integrated Assessment) සමීක්ෂණයක් පවත්වන ලදී. එකී තක්සේරුවේ ප්‍රතිඵල අනුව විගණනයේදී නිරීක්ෂණය වූයේ ඉලක්ක 169 න්, රටෙහි සන්දර්භයට අදාළ නොවන ඉලක්ක 16 ක්, රාජ්‍ය ආයෝජන වැඩසටහනෙහි සමාන ඉලක්ක නොමැති වීම හේතුවෙන් ගැලපිය නොහැකි ඉලක්ක 44 ක්, ඉලක්ක 64 ක් පූර්ණ වශයෙන් හා ඉලක්ක 45 ක් අර්ධ වශයෙන් රාජ්‍ය ආයෝජන වැඩසටහනට පෙළ ගස්වා තිබූ බවයි. අර්ධ වශයෙන් පෙළ ගැස්වීමට හේතු වූයේ විෂය පථය, අභිලාෂය හෝ ඉටු කරගැනීම් මිනීමට දර්ශක නොමැති වීමයි.

### 3.1.6 රාජ්‍ය ආයෝජන වැඩසටහන තිරසර සංර්ධන අරමුණු හා ගැලපීම

(අ) තිරසර සංවර්ධන අරමුණු සමඟ ජාතික ප්‍රතිපත්ති පෙළගැස්වීම පිළිබඳ අවබෝධ කරගැනීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) පදනම් ලියවිල්ල ලෙස භාවිතා කරගෙන විශ්ලේෂණයක් කර ඇත. මෙම විශ්ලේෂණයේදී, රටේ තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් ලබාගැනීමට තිරසර සංවර්ධන අරමුණුවලට එරෙහිව රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ප්‍රධාන ක්ෂේත්‍ර චිත්‍රනය කරන ලදී.

(ආ) රාජ්‍ය ආයෝජන වැඩසටහනේ විවිධ වූ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ආවරණය කිරීමට, ඉලක්ක මට්ටමේදී තවදුරටත් සියළු පාර්ශවයන් නියෝජනය වන පරිදි විශ්ලේෂණයට, තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සමඟ රාජ්‍ය ආයෝජන වැඩසටහනේ පුමුඛතා ක්ෂේත්‍ර පෙළගැස්වීමට ඉහත කී තිරසර සංවරධන අරමුණු චිත්‍රනය කිරිම භාවිතා කළ හැකිය. විස්තර පහත පරිදි වේ.

**රාජ්‍ය ආයෝජන සැලැස්මේ ප්‍රධාන කොටස් තිරසර සංවර්ධනයට අරමුණු සමඟ ගැලපීම.**

| අරමුණ | තිරසර සංවරධන අරමුණු | ගැලපීම |
|---|---|---|
| | | % |
| 01. | දූප්පත් බව තුරන්කිරීම | 86 |
| 02. | බඩගින්න තුරන් කිරීම | 63 |
| 03. | නීරෝගීකම හා යහ පැවැත්ම | 69 |
| 04. | ගුණාත්මක අධ්‍යාපනය | 100 |
| 05. | ස්ත්‍රී පුරුෂ සමානතාවය | 67 |
| 06. | පිරිසිදු ජලය හා සනීපාරක්ෂක සේවා | 88 |
| 07. | දැරිය හැකි මිලට පිරිසිදු බලශක්තිය | 100 |
| 08. | සුනිසි මෙහෙවර හා ඵලදායි රැකියා | 83 |
| 09. | කර්මාන්ත නව්‍යකරණය හා යටිතල පහසුකම් | 100 |
| 10. | අසමානතා අඩුකිරීම | 60 |
| 11. | තිරසර නගර හා ප්‍රජාවන් | 90 |
| 12. | තිරසර පාරිභෝජනය හා නිෂ්පාදනය | 64 |
| 13. | කාලගුණ ක්‍රියාකාරකම් | 80 |
| 14. | ජලය යට ජීවය | 30 |
| 15. | ගොඩබිම මත ජීවය | 33 |
| 16. | සාමය, සාධාරණත්වය හා ශක්තිමත් ආයතන | 42 |
| 17. | අරමුණු ළඟාකර ගැනීමට සහභාගිත්වය | 26 |

(ඇ) අදාල අරමුණු කෙරෙහි යොමු වී තිබූ අවධානය අනුව අරමුණු 14,15,16,17 ගැලපීම අඩුවීම නිසා ආයෝජන සැලැස්ම පාරිසරික පැතිකඩයන්ට වඩා ආර්ථික හා සාමාජීය පැතිකඩයන්ට අවධානය යොමු කර ඇති බව නිරීක්ෂණය විය.

### 3.1.7 අයවැය ලේඛන, ප්‍රතිපත්ති සහ වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණුවලට පෙළගැස්වීම

රටෙහි සන්දර්භයට අනුව තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී අයවැය ලේඛන, ප්‍රතිපත්ති සහ වැඩසටහන් පෙළ ගැස්වීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු විගණනයේදී නිරීක්ෂණය විය. 2017 වර්ෂයේ ජාතික අයවැය ඇස්තමේන්තු තිරසර සංවර්ධන අරමුණු සඳහා පෙළගස්වා නැත. එහෙත් 2018 වර්ෂය සඳහා අයවැයෙන් ව්‍යාපෘතිවල කාර්යසාධන පදනම් කරගනිමින්, තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමට යොමු වී ඇත. ඒ අනුව ප්‍රධාන ව්‍යාපෘතිවල මැනිය හැකි කාර්යසාධන දර්ශකයන් හඳුනාගැනීමට අවධානය යොමු වී ඇත.

## 3.2 අයවැය යෝජනා හරහා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම

### 3.2.1 දිළිඳුකම පිටුදැකීම - අරමුණු 1

**(අ) 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාළ ප්‍රතිපාදන**

2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශන සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2017 ජුලි මස 25 දින අංක 2/2017 දරන අයවැය චක්‍රලේඛ පිළියෙල කිරීමේ පුළුල් දැක්මට ඇතුළත් වන අවශ්‍යතාවයක් වනුයේ 2030 වන විට තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම සඳහා ඒ දෙසට ගමන් කිරීමයි. ඉහත චක්‍රලේඛයේ අංක 06 යටතේ 2017 වර්ෂයේ අඩු සංවර්ධනයක් ඇති දිස්ත්‍රික්කයන්හි දැනටමත් ක්‍රියාත්මක ඉලක්කගත වැඩසටහන් ඇතුළුව දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් හා සම්බන්ධිත ගැටළු විසඳීම සඳහා අවශ්‍ය වැඩසටහන්, දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති හරහා සෑම රේඛීය අමාත්‍යාංශයකම ලේකම්වරුන් කළ යුතු බව දක්වා තිබුණි.

**(ආ) 2018 වර්ෂයේ ප්‍රගතිය**

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව දිළිඳුකම තුරන් කොට තිරසර සංවර්ධන ගමන් මඟකට ලෝකය ගමන් කරවීම පිණිස ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අයවැය දෙපාර්තමේන්තුව ඉහත චක්‍රලේඛ ප්‍රකාරව අයවැය යෝජනා කැඳවා ඇත. ඒ අනුව 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අමාත්‍යාංශ 52 කින් අමාත්‍යාංශ 04 ක් පමණක් දිළිඳුකම පිටුදැකීම සඳහා රු.මිලියන 47,330 ක් වැය කර ස්වභාවික විපත් අවම කිරීම, ජීවන තත්ත්වය නඟා සිටුවීම, ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් කාර්යසාධන දර්ශක සහිතව ක්‍රියාත්මක කර තිබුණි.

**(ඇ) 2019 අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාල ප්‍රතිපාදන**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 ජුලි 17 දින අංක 4/2018 ජාතික අයවැය චක්‍රලේඛය අනුව දිළිඳුකම පිටුදැකීමට අවධානය යොමු කළ යුතු බව දක්වා තිබුණි. එබැවින් 2019 අයවැය ඇස්තමේන්තුව තුළ අමාත්‍යාංශවල ව්‍යාපෘති හරහා හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා ප්‍රමාණවත් පරිදි සම්පත් බෙදාගැනීම කළ යුතු බව දක්වා ඇත. 2019 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වලින් දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය රු.මිලියන 127,020 ක් හා වැඩසටහන් 06 ක් වේ. ඒ අනුව අමාත්‍යාංශ 37 කින් අමාත්‍යාංශ 06 ක් පමණක් දිළිඳුකම පිටුදැකීම සඳහා රු.මිලියන 127,020 ක් වැයකර ණය ලබා දීම, යටිතල පහසුකම් දියුණු කිරීම, කෘෂිකර්මය දියුණු

කිරීම, සමෘද්ධි වැඩසටහන, ඉඩම් කළමනාකරණය ඉලක්ක කරගත් වැඩසටහන් කාර්යසාධන දර්ශක සහිතව ක්‍රියාත්මක කර තිබුණි. 2018 හා 2019 වර්ෂ වෙනුවෙන් වෙන් කර ඇති මුදල පිළිවෙලින් රු.මිලියන 47,330 ක් හා රු.මිලියන 127,020 ක් වූ අතර මුළු අයවැය ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 1 ක් හා සියයට 4 ක් වශයෙන් විය. විස්තර උපලේඛන 01 හි දැක්වේ.

### 3.2.2 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය - අරමුණු 05

**(අ) 2018 අයවැය ප්‍රතිපාදනය**

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දින අංක BD/CBP/4/1/2-2018 දරන චක්‍රලේඛය යටතේ 2018 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සියළුම අමාත්‍ය ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් විසින් ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලැස්මට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා අදාළ ඉලක්ක දේශීය අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට සකස් කළ යුතුය. ඒ සඳහා මූල්‍ය හා භෞතික සම්පත් ලබාගැනීම සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය කළ යුතු බව දක්වා තිබුණි.

**(ආ) ප්‍රධාන අයවැය ධාරාවට ඇතුලත් වූ කාර්යයන්**

ඉහත චක්‍රලේඛය ප්‍රකාරව පහත කරුණු ප්‍රධාන අයවැය ධාරාවට එකතු කළ යුතු බව දක්වා ඇත. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා කාන්තාවන්, ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු 5 යටතේ දක්වා ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් භාගයකට වඩා කාන්තාවන්ය. ඒ අනුව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් කාර්යසාධන දර්ශක සකස් කර ඇත. එම දර්ශක අනුව අදාළ ආයතන විසින් අයවැය යෝජනාවල අදාළ කාර්යසාධන දර්ශක ඇතුළත් කළ යුතු බව දක්වා ඇත. ඒ අනුව 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පරීක්ෂාවේදී තම ඇස්තමේන්තුවල ඇතුළත් ව්‍යාපෘති සඳහා අදාළ අරමුණු හා එයට අදාළ ඉලක්කයන් අමාත්‍යාංශ 52 කින් අමාත්‍යාංශ 4 ක් පමණක් ඇතුලත් කර ඇති අතර ඒ සඳහා ඉලක්ක හඳුනාගැනීම, කාර්ය සාධන දර්ශක හඳුනාගැනීම, තිරසර සංවර්ධන ප්‍රධාන අරමුණුවලට යොමුව සකස් කර හඳුනාගෙන තිබුණි. මෙම අමාත්‍යාංශ 04 යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 7,421 ක් වෙන්කර තිබූ අතර එය මුළු අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 0.2 ක් විය.

**(ඇ) 2019 අයවැය ප්‍රතිපාදන**

2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල තිරසර සංවර්ධන අරමුණු 5 යටතේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වෙනුවෙන්ම ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා චක්‍රලේඛ නිකුත්කර නොතිබුණු අතර කාන්තා හා ළමා කටයුතු හා වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය පමණක් රු.මිලියන 214 ක් වැය කර කාන්තා හා ළමා අභිවෘද්ධිය වෙනුවෙන් වැඩසටහන් ඉලක්ක ගත කර තිබුණි. එය මුළු අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 0.006 ක් විය.

### 3.2.3 කිසිවකු අත් නොහැරීමේ සංකල්පය (අරමුණු 17 ම අදාළව)

මෙම අරමුණු තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සමානාත්මතාවය ආරක්ෂා කිරීමට පහත සඳහන් පියවර ගෙන ඇත.

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදය අනුව සෑම ශ්‍රී ලාංකිකයෙකුටම තම අභිමත ආගමක් ඇදහීමේ නිදහස, විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස, සිතීමේ නිදහස, සමානාත්මතාවයෙන් යුක්තවීමේ නිදහස, කිසිම තැනැත්තෙකු වධ හිංසා වලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට, දඬුවමකට යටත් නොකිරීම, කතා කිරීමේ නිදහස, රැස්වීමේ හා රැකියාවක් කිරීමේ නිදහස තහවුරු කර දී ඇත.

ii. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු දැනගැනීමේ සම අයිතිය.

iii. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය ප්‍රතිපාදන යටතේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් සමව ලැබීම.

iv. වෙනත් සමාජ ආරක්ෂණ වැඩසටහන්

v. ශ්‍රී ලංකාව මානව සංවර්ධන දර්ශකයේ අගය පෙර වර්ෂවලට සාපේක්ෂව ඉහළ අගයකට නංවා ගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | රටවල් | දර්ශක අංකය |
|---|---|---|
| ------- | ------- | ------------- |
| 2016 | 188 | 73 |
| 2017 | 188 | 73 |
| 2018 | 189 | 76 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා**

**(අ) ජාතික අයවැය චක්‍රලේඛ මගින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සවිබල ගැන්වීම**

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දින අංක බීඩී/සීබීපී/04/01/02/2018 යටතේ 2018 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ලබාදෙන මාර්ගෝපදේශ ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා ඉලක්ක දේශීය අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට සකස් කළ යුතු බව දක්වා තිබුණි. එහිදී ඉහත කරුණු ප්‍රධාන අයවැය ධාරාවට එකතු කිරීමේදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන කරුණු 7 යටතේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වී ඇත. ඒවා නම්, ඔවුන් ශක්තිමත් පුද්ගලයන් බවට පත්කිරීම සඳහා සෞඛ්‍ය හා පුනරුත්ථාපනය, අධ්‍යාපනය, රැකියා නියුක්තිය, වැඩ කරන පරිසරයක් ඇති කිරීම, දත්ත හා පර්යේෂණ, සාමාජීය ආයතන ඇති කිරීම වේ. රජයේ ප්‍රතිපත්තිය අනුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව රජයේ මුදල් වියදම් කරන ආයතන විසින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණු, අදාල කාර්යයන් හඳුනාගෙන මූල්‍ය සම්පත් ඒ අංශ කරා යොමුකර ඔවුන් හට සම අවස්ථා සමාජයේ ලබා දීම කළ යුතුය. එහිදී 2018 අමාත්‍යාංශ 52 න් අමාත්‍යාංශ 03 ක් පමණක් ඒ සඳහා අවධානය යොමු කර තිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 3,550 ක් සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණි.

**(ආ) අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක විය යුතු ව්‍යාපෘති**

2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා ඉහත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් බලගැන්වීම සම්බන්ධව චක්‍රලේඛ නිකුත් කර නොතිබුණි. 2019 වර්ෂයේ දී තිරසර සංවර්ධන අරමුණු 10 හි ඉලක්ක 2 අනුව 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිත බව, ජනවර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය සඳහා අමාත්‍යාංශ 37 කින් එක් අමාත්‍යාංශයක් පමණක් ව්‍යාපෘතියක් යෝජනා කර තිබුණි.

**(ඇ) කිසිවකු අත් නොහැරීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීම**

2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව සියළු පාර්ශවල අපේක්ෂා සපිරුණ, කිසිදු කෙනෙකු අතර මග දමා නොයන ලෙස නීති රීති හා වැඩසටහන් නිර්මාණය කිරීමට හා ක්‍රියාවේ යෙදවීම හා එම වැඩසටහන්වල ප්‍රගතිය මැනීම මගින් තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට ඉලක්ක සාදා ඇත. එම ඉලක්ක සපුරා ගැනීමේදී සෑම දර්ශකයක්ම සියළු පාර්ශවයන් නියෝජනය වන පරිදි සකස් කළ යුතුය. ඉලක්ක 169 ක් සඳහා සකස් කර ඇති දර්ශක 244 ට අදාළව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සකස් කර ඇති දර්ශක පරීක්ෂාවේදී ඉහත න්‍යාය පත්‍රය අනුව සියළු පුද්ගලයන් නියෝජනය වන පරිදි සකස් කල ඉලක්ක 13 න් (1.2, 2.2, 2.3, 4.5, 4.4, 4.6, 4.9, 6.2, 8.5, 11.2, 11.7, 13.b, 17.18) පාදක දත්ත සකස් කර ඇත්තේ ඉලක්ක 5 ක් සඳහා පමණක් (1.2, 2.2, 4.4, 4.a, 8.5) බවත් නිරීක්ෂණය විය.

**(ඇ) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්**

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2001 වර්ෂයේ කරන ලද සංගණනය අනුව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු පහත පරිදි වේ. එම සංගණනයට අදාල කරගෙන ඇත්තේ දිස්ත්‍රික්ක 25 න් 18 ක් පමණි. එනම් සියයට 72 ක ප්‍රමාණයකි. එම දිස්ත්‍රික්ක 18 පදනම් කරගෙන විවිධ වූ ආබාධිත තත්ත්වයන් අනුව ඔවුන් නියෝජනය වන ප්‍රතිශතයන් පහත දැක්වේ.

**ප්‍රතිශත අනුව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ ආබාධිත තත්ත්වයන් -2001**




තවද ඉහත ප්‍රතිශත වලින් නියෝජනය වූ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අධ්‍යාපන තත්ත්වයන් විග්‍රහ කිරීමේදී පාසල් නොයාම, වසර 6-8 සමත් වීම, උපාධි ලබාගැනීම පිළිවෙලින් 87,107 ක්, 47,398 ක් හා 783 ක් වී තිබුණි. එය පහත ප්‍රස්තාරය මගින් දැක්වේ.

**විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අධ්‍යාපන තත්ත්වය (දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 18 ක තත්ත්වය)**



**(ඉ) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් තම ජීවනෝපාය සලසා ගැනීම**

මෙහිදී වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් එනම් සියයට 25 ක් ආබාධිත වී ඇත්තේ තම කකුල්වල පවතින ආබාධ නිසා බවත්, ඒ අයගේ අධ්‍යාපන මට්ටම පරීක්ෂාවේදී සියයට 32 ක් පාසල් නොයන බවත්, සියයට 73 ක් රැකබලා ගන්නේ තම ඥාතීන් බවත් නිරීක්ෂණය විය. ඒ අනුව එම පුද්ගලයන් සමාජය තුළ දැඩි අසරණභාවයට පත් වී ඇත. එම පුද්ගලයන් වෙනුවෙන් විශේෂ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය. විස්තර පහත පරිදි වේ.

| ස්ත්‍රී/පුරුෂ | එකතුව | රැකියා කිරීම | පවුලේ ඥාතීන්ගෙන් යැපීම | රජයේ හෝ වෙනත් සංවිධානයකින් යැපීම | සිහමන් යැදීම | අනෙකුත් | විස්තර සොයා ගැනීමට නොහැකි |
|---|---|---|---|---|---|---|---|
| එකතුව | 274,702 | 39,512 | 201,264 | 16,969 | 1,025 | 15,856 | 76 |
| % | 100 | 14.4 | 73.3 | 6.2 | 0.4 | 5.8 | 0.0 |
| පුරුෂ | 158,446 | 33,594 | 104,606 | 9,285 | 758 | 10,152 | 51 |
| % | 100 | 21.2 | 66.0 | 5.9 | 0.5 | 6.4 | 0.0 |
| ස්ත්‍රී | 116,265 | 5,919 | 96,666 | 7,684 | 267 | 5,704 | 25 |
| % | 100 | 5.1 | 83.1 | 6.6 | 0.2 | 4.9 | 0.0 |

**මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2001 සංගණනය**

### 3.2.4 2018 අයවැය ඇස්තමේන්තුවලට තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ඉලක්ක ඇතුළත් නොවීම

**(අ) 2018 අයවැය ඇස්තමේන්තුවල ඉලක්ක ඇතුලත් කිරීම**

2018 වර්ෂයේ අයවැය යෝජනා හරහා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීම යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2017 ජුලි මස 25 දින අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය යටතේ අයවැය පිළියෙල කිරීමේ පුළුල් දැක්මට ඇතුළත් වන වනුයේ 2030 වන විට තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම සඳහා ගමන් කිරීමයි. එහිදී රේඛීය අමාත්‍යාංශ විසින් ප්‍රධාන ව්‍යාපෘති හරහා තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාළ අයවැය යෝජනා ඉදිරිපත් කර තිබුණි. 2018 අයවැය ඇස්තමේන්තු පරීක්ෂාවේදී අමාත්‍යාංශ 52 ක් විසින් තම ප්‍රධාන ව්‍යාපෘති හරහා තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා නොසලකා ඇති තිරසර සංවර්ධන ඉලක්ක ගණන 88 කි. එනම් මුළු ඉලක්ක 169 න් සියයට 52 කි.

ඉහත ඉලක්ක 88 ම රජයේ කිසිඳු අමාත්‍යාංශයක අයවැය ඇස්තමේන්තු තුලට එකතු වී නොමැත. විස්තර උපලේඛන 2 හි දැක්වේ. 2018 වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු වලට අදාළව ඉලක්ක හඳුනා නොගත් අමාත්‍යාංශ ගණන 12 කි. විස්තර පහත පරිදි වේ.

i. බුද්ධ සාසන අමාත්‍යංශය
ii. ආරක්ෂක අමාත්‍යංශය
iii. තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යංශය
iv. අධිකරණ අමාත්‍යංශය
v. විදේශ කටයුතු අමාත්‍යංශය
vi. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය
vii. රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යංශය
viii. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ,පුනරුත්තාපන,නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යංශය
ix. ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශය
x. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය
xi. විදේශ රැකියා අමාත්‍යංශය
xii. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය

**(ආ) 2019 අයවැය ඇස්තමේන්තු අනුව ඉලක්ක ඇතුලත් කිරීම්**

i. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 ජූලි මස 17 දින අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ රේඛීය අමාත්‍යාංශ විසින් ප්‍රධාන ව්‍යාපෘති හරහා තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාල යෝජනාවලින්, 2019 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු පරික්ෂාවේදී අදාල අමාත්‍යාංශ විසින් තිරසර සංවර්ධන අරමුණු තම ප්‍රධාන ව්‍යාපෘතිවලට සම්බන්ධ කර තිබුණි.

ii. 2019 අයවැය ඇස්තමේන්තු පරික්ෂාවේදී අමාත්‍යාංශ 37 ක් විසින් තම ප්‍රධාන ව්‍යාපෘති හරහා තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු වලට ඇතුලත් නොකළ ඉලක්ක ගණන 95 කි. එනම් මුළු ඉලක්ක 169 න් සියයට 56 කි. ඉහත ඉලක්ක 95 රජයේ කිසිඳු අමාත්‍යාංශයක අයවැය ඇස්තමේන්තු වලට ඇතුලත් වී නොමැත. 2019 වර්ෂයේ අමාත්‍යාංශ විසින් සළකා නොබලන ලද ඉලක්ක උපලේඛන 3 හි දැක්වේ. 2019 වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු වලට අදාළව ඉලක්ක හඳුනානොගත් අමාත්‍යාංශ ගණන 09 කි. විස්තර පහත දැක්වේ.

i. ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු බෙදා හැරීමේ කැබිනට් නොවන අමාත්‍යාංශය
ii. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා කැබිනට් නොවන අමාත්‍යාංශය
iii. ජන මාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යාංශය
iv. විශේෂිත ප්‍රදේශ සංවර්ධන කැබිනට් නොවන අමාත්‍යාංශය
v. තැපැල් හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය
vi. විදේශ කටයුතු අමාත්‍යාංශය
vii. විදුලි,බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය
viii. රාජ්‍ය ව්‍යාපාර, කඳුරට උරුමය හා සංවර්ධන අමාත්‍යාංශය
ix. විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය

### 3.2.5 සමාජ, ආර්ථික හා පාරිසරික පැතිකඩයන් සැලකිල්ලට ගැනීම

(අ) තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව ආර්ථික, සාමාජයීය හා පාරිසරික පැතිකඩයන් තුන රාජ්‍ය අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කිරීම



(ආ) උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව පවත්නා ප්‍රමිතය (5130) හි 1.10 අනුව තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය තුල ආර්ථික, සමාජයීය හා පාරිසරික පැතිකඩයන් තුනම එකට සම්බන්ධ වීමෙන් හා තුලනය වීමෙන් පමණක් තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කළ හැකි බව දක්වා ඇත. එම ප්‍රමිතියෙහි 2.9.8 අනුව රාජ්‍ය අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අයවැය ප්‍රතිපාදනවලින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා වෙන්කරන මුදල් ප්‍රමාණය හා එයින් පාරිසරික සංවර්ධනය සඳහා වෙන්කරන මුදල් ප්‍රමාණය කොපමණද යන්න ගැඹුරින් පරීක්ෂා කළ යුතු බව දක්වා ඇත.

(ඇ) තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව ආර්ථික සාමාජීය හා පාරිසරික පැතිකඩයන් සමබර වීම සඳහා පාරිසරික සම්පත් සුරක්ෂිත වීම සඳහා අයවැය ඇස්තමේන්තු අනුව පාරිසරික ඉලක්ක හඳුනාගෙන තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අනුව 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු වල පාරිසරික සම්පත් වැඩිදියුණු කිරීමට ඉලක්ක 13 ක් පදනම්කර ගනිමින් ව්‍යාපෘති 17 ක් සඳහා අමාත්‍යාංශ 52 කින් අමාත්‍යාංශ 11 ක් පමණක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ඈ) 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල පාරිසරික සම්පත් වැඩිදියුණු කිරීමට ඉලක්ක 13 ක් පදනම් කර ගනිමින් ව්‍යාපෘති 17 ක් සඳහා අමාත්‍යාංශ 37 කින් අමාත්‍යාංශ 10 ක් පමණක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

### 3.2.6 රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020 ) - පරිසර සම්පත් සුරැකීම

නියමිත ආයෝජනයන් සිදුකරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට පහසුකම් සලසන අතරතුරදී පාරිසරික ගුණාත්මක බව ආරක්ෂා කරමින් තිරසර සංවර්ධනයක් කෙරෙහි යොමුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුලින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස විසෙන් තොර ආහාර රටාවක් ඇති කිරීම සඳහා පරිසර සංරක්ෂණය තුල හරිත වර්ධනය යන සංකල්පය මගින් වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. 2015 පසු සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව හඳුනාගත් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් අනුව යමින් රජයේ ප්‍රතිපත්ති රාමුව තුල (2017-2020) රාජ්‍ය ආයෝජන වැඩසටහන පරිසර සංරක්ෂණයට ප්‍රමුඛතාවයක් ලබා දී තිබුණි. ශ්‍රී ලංකාව 2018 වර්ෂයේ පරිසර කාර්යසාධන දර්ශකයෙහි හිමිවූ ස්ථානයේ සිට 2020 වන විට අවම වශයෙන් 25 ස්ථානය දක්වා යාමට රාජ්‍ය ආයෝජන වැඩසටහන අනුව අපේක්ෂා කර තිබුණි.

**පාරිසරික කාර්යසාධන දර්ශකය**

| **වර්ෂය** | **පාරිසරික කාර්යසාධන දර්ශකය** |
|---|---|
| 2016 | 108 |
| 2017 | ප්‍රකාශයට පත් වී නොමැත. |
| 2018 | 60 |
| 2019 | ප්‍රකාශයට පත් වී නොමැත |
| 2020 | 25 |

**මූලාශ්‍ර:- 2017 – 2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන**

ඉහත පාරිසරික කාර්යසාධන දර්ශක තත්ත්වය ළඟාකර ගැනීම සඳහා තම ප්‍රතිපත්ති රාමුව තුල හඳුනාගත් පරිසර ගැටලු පහත පරිදි වේ.

**(අ) වන ගහනය**

2015 – 2017 රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීමේදී පැවති වන ගහනය සියයට 29.7 වී ඇති අතර 2018 ජූලි මස තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ස්වේච්ඡා ජාතික සමාලෝචනය අනුව එය සියයට 29 ලෙස දක්වා ඇත. ඒ අනුව ක්‍රමානුකූලව වනාන්තර අඩුවී යන බව නිරීක්ෂණය වේ.



**(ආ) වෙරළ කලාප දූෂණය**

දශක කිහිපයක් තුල ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය දූෂණය වීම ඉහළ යමින් පවතින අතර මෙසේ වෙරළ කලාපය දූෂණය වීමට ප්‍රධාන හේතූන් ලෙස ජනගහනය කේන්ද්‍රගතවීම හා සංචාරක සහ කාර්මික අංශවල සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත. මල අපද්‍රව්‍ය, නයිට්‍රජන් හා පොස්පරස් වැනි පෝෂක කාබනික

අපද්‍රව්‍ය, බැර ලෝහ, තෙල් සහ තාප දූෂක වෙරළ කලාපය දූෂණය වීමට බලපාන මූලික දූෂක වර්ග වේ.



**(ඇ) වායු දූෂණය**

කොළඹ හා මහනුවර යන නගරවල වායු දූෂණය ප්‍රධාන පාරිසරික ගැටළුවක් වී ඇත. මිලියන 4 කට වඩා වැඩි ක්‍රියාකාරී වාහන සංඛ්‍යාවකින් සමන්විත ප්‍රවාහන ක්ෂේත්‍රය වායු දූෂණයට ප්‍රධානතම හේතු කාරකය ලෙස හඳුනාගෙන ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ කොටුව සංසරණ වායු තත්ත්ව පසු විපරම් මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ දත්ත අනුව ප්‍රශස්ත ශුද්ධ අංශුමය පදාර්ථ වල වාර්ෂික මධ්‍යයන මට්ටම pm 10 පැය 24 ක සාමාන්‍ය අගය 63 $Ugm^{-3}$ ක් වේ. බත්තරමුල්ල වායු තත්ත්ව පසු විපරම් මධ්‍යස්ථානයේ දත්ත අනුව 2019 නොවැම්බර් මස pm 10 අගය 43.16 ක් වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ප්‍රමිති අනුව pm10 හි අගය = 50 $Ugm^{-3}$ හෝ එයට වඩා අඩු විය යුතුය. නමුත් මෑතකාලීනව කොළඹ නගරයේ වායු දූෂණය නියමිත ප්‍රමිත මට්ටම් ඉක්මවීම් හෝ එම ප්‍රමිත මට්ටම්වලට ආසන්න වෙමින් පවතින බව දත්ත අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව කොළඹ නගරයේ වායුව දූෂණය වෙමින් පවතින බව ඉහත දත්ත අනුව නිරීක්ෂණය වේ.



**(ඇ)　ජල දූෂණය**

ශ්‍රී ලංකාවේ ජල දූෂණයට ප්‍රධානතම හේතු කාරකයක් වන්නේ දූර්වල සනීපාරක්ෂාව, පිළියම් (Treatment) නොකරන ලද හෝ පිළියම් කරන ලද අප ජලය මගින් නයිට්‍රේට් සහ බැක්ටිරියා මතුපිට ජල ප්‍රභවයන්ට එකතු වීම, කාර්මික හා කෘෂිකාර්මික විෂ රසායන හා ජලාශයන්හි දුෂ්පෝෂණය යන කරුණුය. නාගරික ප්‍රදේශයන්හි ජල දූෂණයට ආසන්න හේතුව වන්නේ ගෘහාශ්‍රිත හා කාර්මික අපද්‍රව්‍ය මෙන්ම අප ජලය ජල මාර්ගයට එකතු වීමයි. කෘෂිකාර්මික ප්‍රදේශවලදී කෘෂි රසායන ද්‍රව්‍ය ප්‍රධානතම ජල දූෂ්‍යකාරකය වේ. මෙයට අමතරව නියැදි පරීක්ෂාවට ලක් වූ වාණිජ හා පරිපාලන නගර ආශ්‍රිතව ගලා බසින කැළණි ගඟ මගින් ප්‍රාදේශීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට බෙහෙවින් උපකාරී වුවද, කාර්මීකරණය හා අනවසර ඉදි කිරීම් නිසා පාරිසරික වශයෙන් දූෂණය වීම කෙරෙහි අදාළ වගකිව යුතු ආයතනවල අවධානය ප්‍රමාණවත් නොවීය.



**(ඉ) අලි මිනිස් ගැටුම**

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් සියයට 20 ක් පමණ මුහුණ පා සිටින බරපතල ගැටළුවක් වන්නේ අලි මිනිස් ගැටුමයි.

**මිනිස් හා වන අලි ජීවිත හානි**

| | **අහිමි වූ ජීවිත සංඛ්‍යාව** | |
|---|---|---|
| **වර්ෂය** | **මිනිස්** | **වන අලි** |
| 2010 | 81 | 227 |
| 2011 | 60 | 255 |
| 2012 | 73 | 250 |
| 2013 | 70 | 206 |
| 2014 | 67 | 231 |
| 2015 | 63 | 205 |
| 2016 | 88 | 279 |
| 2017 | 87 | 256 |
| 2018 | 96 | 319 |
| 2019 නොවැම්බර් දක්වා | 114 | 379 |

**මූලාශ්‍රය : වන ජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තා**

එම ගැටුම ක්‍රමානුකූලව වැඩිවෙමින් පවතී. අලින්ගේ ස්වභාවික වාසභූමි මිනිසුන් විසින් ආක්‍රමණය කිරීම නිසා මෙම ප්‍රශ්නය මතු වී ඇත. නමුත් මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ග අසාර්ථක වී ඇති බව මිනිස් මරණ හා අලි මරණ වැඩිවීමෙන් නිරීක්ෂණය වේ.



(ඊ) අපද්‍රව්‍ය කළමනාකරණය

i. අපද්‍රව්‍ය ජනනය වීමේ සීඝ්‍රතාවය ඉහළයෑම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම පරිසර ගැටළුවක් බවට පත්වී තිබේ. 1970 දී සියයට 10 ක් වූ නාගරික ජනගහන වර්ධනය 2015 වන විටදී සියයට 40 ක් දක්වා ඉහළ ගොස් ඇත. එක් දිනකදී ශ්‍රී ලංකාව තුළ සමස්ත වශයෙන් මෙ.ටො. 6500 ත් 7000 ත් අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය වන අතර ඉන් නිසි පරිදි බැහැර කරනු ලබන්නේ සියයට 39 ප්‍රමාණයක් පමණක් බව 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහනේ දක්වා තිබුණි. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර වර්ධනයක් සමඟ පරිසරයට හානි කර වූ අහිතකර ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ජනනය ඉහළ ගොස් තිබේ. රෝහල්වලින් මෙට්‍රික් ටොන් 5400 ක් පමණ වන සායනික අපද්‍රව්‍ය පරිසරයට එක්වේ.

**ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ජනනය හා එකතු කිරීම**

| අපද්‍රව්‍ය වර්ගය | වසරකට ජනනය වන ප්‍රමාණය | වසරකට එකතු කරන ප්‍රමාණය | හිඟය |
|---|---|---|---|
| පරිගණක යන්ත්‍ර | 53,146 | 15,944 | 37,202 |
| මුද්‍රණ යන්ත්‍ර | 19,509 | 5,852 | 13,657 |
| රූපවාහිනී යන්ත්‍ර | 63,471 | 19,042 | 44,429 |
| ජංගම දූරකථන | 903,544 | 271,063 | 632,481 |
| ශීතකරණ යන්ත්‍ර | 39,009 | 11,702 | 27,307 |
| වායු සමීකරණ යන්ත්‍ර | 7,092 | 2,127 | 4,965 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 758 | 227 | 531 |
| රෙදි සෝදන යන්ත්‍ර | 11,107 | 3,332 | 7,775 |
| CLF බල්බ (මිලියන) | 2.4 | 0.72 | 1.68 |

**මූලාශ්‍රය - මධ්‍යම පරිසර අධිකාරිය -2008**

ii. 2008 පසු ඉහත දත්ත මධ්‍යම පරිසර අධිකාරිය සතුව නොමැත. දත්ත යාවත්කාලීන නොවීමෙන් මෑත කාලීන ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ජනනය පිළිබඳව තීරණ ගැනීමේදී ප්‍රශ්න මතුවේ. නිසි ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද සඳහාත්, අදාල ආයතනවල සැලසුම් සකස් කිරීම සඳහාත්, තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමේ ප්‍රගතිය මැනීම සඳහාත්

දර්ශක හා පාදක දත්ත අවශ්‍ය වේ. මධ්‍යම පරිසර අධිකාරිය 1980 අංක 47 දරන පරිසර පනත අනුව පරිසරය පිළිබඳ සියළු දත්ත පවත්වා ගත යුතු වුවත් එසේ නොමැතිවීමෙන් පවතින තත්ත්වය මැනිය නොහැකි වී තිබුණි.

iii. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන්ද අදාළ පළාත් පාලන ආයතන විසින් ස්ථිර සාර විසඳුම් ලබා දී නොමැති වීම, පාරිසරික වශයෙන් මෙන්ම ජන ජීවිතයටද ප්‍රබල ලෙස බලපාන සාධකයක් වේ. එම ආයතන විසින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සැලසුම් කිරීම, ස්ථාපිත කිරීම, නියාමනය හා අපද්‍රව්‍ය යොමු කිරීමේ කාර්යයන්වල අඩුපාඩු මේ සඳහා බලපා තිබුණි.

(ඇ) **ආපදා කළමනාකරණය**

i. ගෝලීය උෂ්ණත්වයේ ඉහළ යෑමට ශ්‍රී ලංකාවේ දායකත්වය මිනිය නොහැකි තරම් අවම වුවද දූපත් රාජ්‍යයක් වශයෙන් අප දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්වලට ලක්වීමේ අවධානම ඉතා ඉහළය. රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) අනුව ස්වභාවික ආපදා හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධ අංශයන්ගෙන් සිදුවන අලාභය වසරකට බිලියන 50 ක් වන අතර වාර්ෂිකව ආර්ථිකයේ අලාභය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.5 කට සහ සම්පූර්ණ රාජ්‍ය වියදමෙන් සියයට 3 කට සමාන බවට ගණන් බලා ඇත. පසුගිය දශකය තුල මිලියන 13 කට වැඩි ජනතාවක් විපතට පත්වී ඇති අතර සහන සඳහා රු.බිලියන 6 ක මුදලක් වැයකර ඇත. ශ්‍රී ලංකාව 2017 වර්ෂයේ ලෝකයේ කාලගුණික අවධානම් දර්ශකයේ 2 වන ස්ථානයට පත් ව ඇත. විස්තර පහත වගුවේ දැක්වේ.

**2017 කාලගුණ අවදානම් දර්ශකය අනුව ශ්‍රී ලංකාවේ තත්ත්වය**

| රට | **ස්ථානය** |
|---|---|
| පිසම්රෝ ජිකෙන් | 1 |
| ශ්‍රී ලංකාව | 2 |
| ඩොමිනිකා | 3 |
| නේපාලය | 4 |
| පේරු | 5 |

**මූලාශ්‍රය -ලෝක කාලගුණ අවදානම් දර්ශකය**

ii. වර්ෂාව හේතුවෙන් ගංගා පිටාර ගැලීම බහුලව නිරීක්ෂණය වන ආපදා තතත්වයක් වන අතර ඒවා පාලනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර ගෙන නොමැත. ඊට අමතරව කඳුකර ප්‍රදේශ වලින් වාර්තා වන නාය යාම් සම්බන්ධයෙන් එම ස්ථාන හඳුනා ගැනීම, නැවත පදිංචි කිරීම හා නාය යාම සඳහා හේතුවන කරුණු පාලනය සඳහා යොමු වී ඇති අවධානය ප්‍රමාණවත් නොවීය.

### 3.2.7 රාජ්‍ය ආයතන වල සහභාගිත්වය

**(අ) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ කාර්යසාධනය**

2019 මැයි මස 07 වන දින අංක 03/04/45/SD දරන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව එම අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු 12 , 13 ,14,15 සඳහා ඍජුවම වගකීමට යටත්වන බව දක්වා තිබුණි. එම අරමුණු පහත පරිදි වේ.

i. තිරසර පාරිභෝජනය හා නිෂ්පාදනය - 12
ii. දේශගුණ විපර්යාස අවම කිරීම සහ එහි බලපෑම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම -13
iii. තිරසර සංවර්ධනය උදෙසා සමුද්‍ර සම්පත් සංරක්ෂණය - 14
iv. භෞතික පරිසර පද්ධති සංරක්ෂණය, ප්‍රතිස්ථාපනය හා තිරසර භාවිතය -15

v. 2018 අයවැය ඇස්තමේන්තු අනුව අමාත්‍යාංශය විසින් හඳුනාගත් ඉලක්ක - 7 පැවතුණි. විස්තර පහත පරිදි වේ.

| **ඉලක්කය** | **විස්තරය** |
|---|---|
| 2.1 | සාගින්න තුරන් කිරීම |
| 6.1 | අඩු මිලට ආරක්ෂාකාරී ලෙස පානීය ජලය ලබාදීම |
| 7.1 | අඩු මිලට විශ්වාසදායී නවීන බලශක්තිය ලබාදීම |
| 13.1 | ස්වාභාවික අපදාවලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම |
| 12.5 | අපද්‍රව්‍ය, උත්පාදනය වැළැක්වීම, අඩුකිරීම, ප්‍රතිචක්‍රීකරණය හා නැවත භාවිතය |
| 15.1 | භූමිය තිරසර ලෙස භාවිතය |
| 15.2 | තිරසර ලෙස වනාන්තර කළමනාකරණය |

ඉහත තොරතුරු අනුව අමාත්‍යාංශයේ වගකීමක් ලෙස අරමුණු 14 හඳුනාගෙන තිබූ නමුත්, 2018 අයවැය ඇස්තමේන්තු අනුව ව්‍යාපෘති හඳුනාගෙන අරමුදල් වෙන්කරගැනීම සිදු කර නොතිබුණි.

vi. 2019 අයවැය ඇස්තමේන්තු අනුව හඳුනාගත් ඉලක්ක 4 පැවතුණි. විස්තර පහත පරිදි වේ.

| **ඉලක්කය** | **විස්තරය** |
|---|---|
| 12.5 | අපද්‍රව්‍ය, උත්පාදනය වැළැක්වීම, අඩුකිරීම, ප්‍රතිචක්‍රීකරණය හා නැවත භාවිතය |
| 2.1 | සාගින්න තුරන් කිරීම |
| 6.1 | අඩු මිලට ආරක්ෂාකාරී ලෙස පානීය ජලය ලබාදීම |
| 13.1 | ස්වාභාවික අපදාවලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම |

ඉහත තොරතුරු අනුව අමාත්‍යාංශයේ වගකීම් ලෙස අරමුණු 14 හා 15 හඳුනාගෙන තිබූ නමුත් 2019 අයවැය ඇස්තමේන්තු අනුව ව්‍යාපෘති හඳුනාගෙන අරමුදල් වෙන්කර ගැනීම් සිදුකර නොතිබුණි.

**(ආ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව ආයතනය විසින් ක්‍රියාත්මක කරන සියළු ව්‍යාපෘති හා කාර්යභාරයන් තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුව සකස් කරමින්, පවතින අතර ඉලක්ක යටතේ කාර්ය සාධන නිර්නායක සකස් කර ප්‍රගතිය වාර්තා කිරීම සඳහා දත්ත රැස් කරමින් සිටින බවත්, 2018 වර්ෂයේදී හා 2019 වර්ෂයේදී කාර්යසාධන ඉලක්ක සකස් කර නොතිබූ නිසා ඉලක්ක ගත කාර්ය සාධන දර්ශකයන්ට අනුකූලව ප්‍රගතිය වාර්තා කිරීමට නොහැකි බව වාර්තා කර තිබුණි. එම නිසා 2018 සහ 2019 වර්ෂවල සමස්ත භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව නාය යාම් හා ස්වාභාවික ආපදා පිළිබඳව වැදගත් තොරතුරු රජයට හා මහජනතාවට ලබාදිය යුතු මෙම ආයතනය 2019 වර්ෂයේදීත් තම ආයතනයේ කාර්යසාධන ඉලක්ක වලට අදාල ප්‍රගතිය ලබාදී නොතිබුණි.

**(ඇ) මධ්‍යම පරිසර අධිකාරිය**

තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව 1980 අංක 47 දරන පරිසර පනත අනුව පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරිය සතු වේ. ඒ අනුව තිරසර සංවර්ධනයේ පාරිසරික පැතිකඩ ආරක්ෂා කිරීම සඳහා මෙම ආයතනය දක්වන දායකත්වය පරීක්ෂාවේදී පරිසර අධිකාරියේ 2019 වර්ෂයට අදාල දත්ත අනුව නාගරික ඝන අපද්‍රව්‍ය වලින් සියයට 84 ක් නිසි පරිදි අපහරණයට ලක් නොවීම, ජාතික ප්‍රතිචක්‍රීකරණ අනුපාතය සියයට 5 ක් වීම, ඒක පුද්ගල උපද්‍රවකාරී අපද්‍රව්‍ය ජනනය 2018 සිට 2019 දක්වා කි.ග්‍රෑම් 9.5 සිට කි.ග්‍රෑම් 13 දක්වා වැඩිවීම, පිළියම් කරන උපද්‍රවකාරී අපද්‍රව්‍ය අනුපාතය අඩුවීම, දහනය කරනු ලබන සායනික අපද්‍රව්‍ය ප්‍රතිශතය අඩුවීම, ප්‍රතිචක්‍රීකරණය සඳහා අපනයනය කරන ඉලෙක්ට්‍රොනික් අපනයන ප්‍රතිශතය පමණක් වැඩිවීම යන කාර්යසාධන තොරතුරු මෙහිදී ප්‍රධාන තැනක් ගැනුණි. ඒ අනුව අදාළ අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟාවී නොතිබුණි. විස්තර උපලේඛන 04 හි දැක්වේ.

**(ඇ) ජාත්‍යන්තර හා දේශීය ප්‍රමිති සහතික ලබා ගැනීම**

තිරසර සංවර්ධන අරමුණ සම්බන්ධව උත්තරීතර විගණන ආයතනයන්හි ජාත්‍යන්තර සංවිධානයේ ප්‍රමිත අංක 5130 හි 2.19 අනුව යම් කිසි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන ස්ථානයේ කරන කටයුතු වල පාරිසරික කළමණාකරණය මත තිරසර සංවර්ධනයේ ප්‍රතිපල ළඟා කර ගත හැකි බව ජාත්‍යන්තර පිලිගැනීම බව ප්‍රකාශ කර ඇත. එම ජාත්‍යන්තර ප්‍රමිත වල අරමුණ වන්නේ පාරිසරික කළමණාකරණය පොදු ප්‍රවේශයක් තුළ කිරීම හා එමගින් පාරිසරික කාර්යසාධනය මැනීමයි. මෙම ප්‍රමිත සියළුම ආයතනවවලට භාවිතා කළ හැකි අතර විවිධ භූගෝලීය හා සංස්කෘතික හා සමාජීය තත්ත්වයන් වලදීත් පොදු වේ.මෙම ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිත වල නිර්නායක වලට අනුව කටයුතු කිරීමෙන් රජයේ හා පෞද්ගලික ආයතනවලට තම නිෂ්පාදන හා සේවා උපරිම ගුණාත්මකභාවයෙන් මහජනයාට ලබාදීමටත් එමගින් පාරිසරික කළමණාකරණය ඇති කිරීමටත් හැකිවේ. ශ්‍රී ලංකාවේ ප්‍රමිත සහතික ලබාදෙන රජයේ ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වේ. මෙම ආයතනය රජයේ හා පෞද්ගලික අංශයේ ආයතනවලට ප්‍රමිත සහතික ලබාදෙයි. ප්‍රමිත ආයතනය විසින් 2019 වර්ෂයේ රජයේ හා පෞද්ගලික අංශයේ ආයතන 1339 කට ප්‍රමිත සහතික ලබා දී ඇත.

**(ඉ) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව**

i. සංවර්ධනය තිරසරව පවත්වාගෙන යාමට ආර්ථික, සාමාජීය හා පාරිසරික පැතිකඩයන් තුලනාත්මකව පවත්වාගෙන යාම සඳහා 2018 ඔක්තෝබර් 02 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 18/2222/805/069 යටතේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ ජනවාරි 01 දින චක්‍රලේඛ අංක MNPEA/2/2019 යටතේ 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන නව ව්‍යාපෘති සම්බන්ධයෙන් ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ මාර්ගෝපදේශයක් සකස් කර තිබුණි.

ii. මෙම මාර්ගෝපදේශය මගින් රජයේ නව ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේදී ඒවා කාර්යක්ෂම ලෙස ඉදිරිපත් කළ යුතු ආකාරය හා ව්‍යාපෘති සම්බන්ධව ආර්ථික, පාරිසරික හා සාමාජීය සංවර්ධනය ළගා කර ගැනීම සඳහා ව්‍යාපෘති වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කරන ආකාරය සඳහන් කර තිබුණි. එය රජයේ සියළුම ආයතන සම්බන්ධයෙන් අදාළ වේ.

iii. එම මාර්ගෝපදේශය අනුව 2019/01/10 සිට ඉදිරිපත් කරන ව්‍යාපාති සඳහා මෙම මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු බව දක්වා තිබුණි.

iv. ඒ අනුව ආර්ථික කටයුතු මෙහෙයවන අංශ 8 ක් වූ අතර 2019 වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති ගණන 322 ක් විය. ඉන් මූලික අනුමැතීන් ලබාගෙන තිබූ ව්‍යාපෘති ගණන 160 ක් වූ අතර එය සියයට 50 ක ප්‍රතිශතයකි. දෙවන අනුමැතිය ලබාගත් ව්‍යාපෘති ගණන 61 ක් වූ අතර එය සියයට 19 ක ප්‍රතිශතයකි. ඒ අනුව අදාළ ව්‍යාපෘති රජය අනුමත නියමිත ක්‍රමවේදයට අනුව ක්‍රියාත්මක කළ යුතු අතර, එසේ නොමැති වුවහොත් එමගින් 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අරමුණු කරා ගමන් කරවීම ගැටලු සහගත විය හැක.

## 3.3 තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් හඳුනාගැනීම

තිරසර සංවර්ධන අරමුණු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සෘජුව බලපාන ප්‍රධාන අවශ්‍යතාවක් වන්නේ මූල්‍යකරණයයි. එමගින් භෞතික සහ මානව සම්පත් අත්පත් කරගැනීම ඒවා ඵලදායී ලෙස යොදාගැනීමට හැකියාව ලැබේ. අවශ්‍යතා හඳුනාගැනීම, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ධාරිතා සම්බන්ධයෙන් පහත සඳහන් තත්ත්වයන් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ)** ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිමෙහි වර්තමාන උපක්‍රමය වන්නේ ප්‍රධාන ධාරාවට ඇතුළත් කිරීමයි. (main streaming) ඒ නිසා අරමුදල් වෙන්කිරීම සඳහා කෙටිකාලීන උපක්‍රමයක් ලෙස තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සඳහා මූල්‍යයනය කිරීමට වාර්ෂික අයවැය ලේඛනය භාවිතා කොට අවශ්‍ය අරමුදල් ලබාදීමෙන් එකී ක්‍රියාවලිය පහසු කරවයි. මූල්‍යකරණයේ ප්‍රභවයන් වන්නේ බදු සහ බදු නොවන ආදායම සහ දේශීය හා විදේශ ණයගැනීම්ය. ඒ සම්බන්ධව පරීක්ෂවේදී රටේ පවතින තත්ත්වය තුළ මූල්‍ය සම්පාදනය අසීරු කටයුත්තක් බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

**(ආ)** 2018 වර්ෂයේදී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සමඟ සම්බන්ධ කළ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මුළු අයවැය ඇස්තමේන්තුව වූ රු.මිලියන 2,997,845 න් (ණය ගෙවීම් අඩුකර) රු.මිලියන 414,075 ක් හෙවත් සියයට 14 ක්, අමාත්‍යාංශ 40 ක් වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන වෙන්කර තිබුණි. 2019 වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සමඟ සම්බන්ධ කළ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මුලු අයවැය ඇස්තමේන්තුව වූ රු.මිලියන 3,340,000 න් (ණය ආපසු ගෙවීම් අඩුකර) රු.මිලියන 572,040 ක් හෙවත් සියයට 17 ක් අමාත්‍යාංශ 28 ක් වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන වෙන්කර තිබුණි.

### 3.3.1 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන්

ජාත්‍යන්තර වශයෙන් වූ සම්බන්ධ වීම් පහත පරිදි විය.

**(අ) ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධ වීම.**

i. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සීඝ්‍ර ඒකාබද්ධ තක්සේරුවට (RIA) සකස් කිරීම මගින් සහාය ලබා දී ඇත.
ii. ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය (UNRC සහ UNESCAP)
iii. 2018 ජූලි මස පැවැත්වූ ස්වේච්ඡා ජාතික සමාලෝචන සඳහා වූ ජාතික බහු සාන්ද්‍රික ප්‍රජා උපදේශක වැඩමුළුව
iv. මොණරාගල දිස්ත්‍රික්කයේ පස් අවුරුදු දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම (UNDP)

v. ජනාධිපති ලේකම් කාර්යාලය සහ UNPFA සම්බන්ධීකරණයෙන් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ආයතනවලින් පාදක දත්ත එකතු කර ගැනීමට දර්ශක රාමුවක් සකස් කිරීම

vi. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන රාමුව (2018-2022) (UNSDF)

vii. 13 වන එක්සත් ජාතීන්ගේ නියෝජිත වැඩසටහන ශ්‍රී ලංකාව සමග ගිවිසුම් රාශියක් මගින් සහයෝගය ලබා දී ඇත. ඒ ආයතන නම් එත්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන,එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) සහ ආසියානු පදනම මගින් අධිකරණ අමාත්‍යාංශය සමග එක් වී ළමයින්ට මිත්‍රශීලි අධිකරණ පිහිටුවීමට සහයෝගය ලබා දි ඇත.

**(ආ) ජාත්‍යන්තර සංවිධාන සමග ගිවිසුම්වලට එළඹීම**

තිරසර සංවර්ධන අරමුණ 17 හි ඉලක්ක 6 යටතේ තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම සඳහා කලාපීය, අන්තර්ජාතික සහයෝගිතාවය ඉහළ නැංවීම, විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මට්ටමේ දැනට පවත්නා යාන්ත්‍රණ අතර සහයෝගිතාවය වැඩි දියුණු කිරීම, ජගත් මට්ටමේ තාක්ෂණ පහසුකම් සැලසීමේ යාන්ත්‍රණයක් මගින් එකිනෙකා සමග එකග වූ කොන්දේසි අනුව දැනුම බෙදා හදා ගැනීම ඉහළ නැංවීම කළ යුතුය. තිරසර සංවර්ධන අරමුණු කරා ගමන් කිරීමේදී රටක් වෙනත් රටවල් හා ජාත්‍යන්තර සංවිධාන සමග ගිවිසුම් වලට එළඹිය යුතුය. එම ගිවිසුම මගින් ලෝකයේ සියළුම රටවල් එකම කාල පරිච්ඡේදයකදී එකම අරමුණක් වෙනුවෙන් තම රජයේ ප්‍රතිපත්ති වලට ගැළපෙන ආකාරයට ඉලක්ක සකස් කරගෙන ඒ සඳහා දර්ශක සකස් කර ගනී. ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් මූල්‍ය හා භෞතික සම්පත් ලබා ගැනීම, දැනුම ලබා ගැනීම හා බෙදා ගැනීම, පුහුණු කිරීම්, එකග වූ ප්‍රමිති අනුව කටයුතු කිරීමට මෙමගින් අවස්ථාව ලැබේ. සෑම රාජ්‍ය ආයතනයක්ම විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු කරා ලගා වීම සඳහා සම්පත් හා ධාරිතා වර්ධනය සඳහා ජාත්‍යන්තරය සමග ගිවිසුම් ගත වීමට අදාළ වගකිව යුතු නිළධාරින් කටයුතු කළ යුතුය. 2018 හා 2019 වර්ෂ වලදී අයවැය ඇස්තමේන්තු පරීක්ෂාවේදී ශ්‍රී ලංකාව අයවැය යෝජනා මගින් ප්‍රධාන ව්‍යාපෘති හරහා තිරසර සංවර්ධන අරමුණු කරා ලගා වීමට අරමුදල් වෙන් කිරීමේදී එවැනි ගිවිසුම් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. 2019 වර්ෂයේ සංචාරක සංවර්ධන, වනජීවී, ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් නීති විරෝධී ශාඛ හා වන

සතුන් ප්‍රවාහනය නැවැත්වීම සඳහා ජාත්‍යන්තර ආයතන සමග ගිවිසුම්වලට (CITES) එළඹීම කර තිබුණි. නමුත් පහත සඳහන් ගිවිසුම් සමග කටයුතු කිරීම සඳහා අදාල අමාත්‍යාංශ විසින් ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

| අනු අංකය | අරමුණ | 2018 හා 2019 වර්ෂවලදී ජාත්‍යන්තර සංවිධාන සමග ගිවිසුම් ගත වීමට අදාළ ඉලක්ක හඳුනා නොගත් අවස්ථා |
|---|---|---|
| i. | 2 | දෝහා න්‍යාය පත්‍රය ප්‍රකාරව අපනයනය දිරි ගැන්වීම, වෙළඳපළවල් ඇති කර ගැනීමට |
| ii. | 5 | බීජිං ක්‍රියාකාරි සැලැස්ම අනුව ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට |
| iii. | 8 | අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ජගත් රැකියා වෙන් කිරීමේ ක්‍රියාවලිය මගින් රැකියා ලබා ගැනීම |
| iv. | 10 | ලෝක වෙළඳ සංගමය සමග සම්බන්ධතා ගොඩ නගා ගැනීම |
| v. | 11 | සෙන්ඩියල් සැලැස්මට අනුව සංවර්ධන සැලසුම් ආර්ථික, සමාජීය හා පාරිසරික යන කරුණු 3 සම්බන්ධ කර ක්‍රියාත්මක කිරීමට |
| vi. | 13 | එක්සත් ජාතීන්ගේ කාලගුණ වෙනස්වීම පිළිබඳ අවධානය යොමුකිරීම |
| vii. | 14 | ලෝක වෙළඳ සංගමයේ ධීවර සහනාධාර ලබා ගැනීම,සමුද්‍රීය සම්පත් වලින් ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම හා සාගර විද්‍යා කොමිසමේ ක්‍රියා පටිපාටිය සමග ගිවිසුම් ගත වීම |
| viii. | 15,16 | ජගත් මට්ටමේ ආයතනවල ශ්‍රී ලාංකික පුද්ගලයින්ගේ සහභාගිත්වයන් ශක්තිමත් කිරීම |
| ix. | 17 | දෝහා න්‍යාය පත්‍රයට අනුගත වී අරමුණු කරා ගමන් කිරීමට හවුල්කාරිත්වය ගොඩනගා ගැනීම |

**(ඇ) දේශීය ධාරිතා වර්ධනය**

ශ්‍රී ලංකාවේ සිසුන් විද්‍යා,ගණිත හා තාක්ෂණ විෂය ධාරා වලට යොමු වීම ඉතා අඩු මට්ටමක පවතී. ඒ අනුව පසුගිය වර්ෂ 03 ක ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාල වලින් උපාධි ලැබූ උපාධිධාරීන්ගේ සාමාන්‍ය සියයට 28 ක් විද්‍යා, ගණිත, ඉංජිනේරු හා තාක්ෂණ උපාධි ලබා ගන්නා බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

**ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාලවල උපාධි ලබාගැනීම**

| විෂය ධාරාව | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| විද්‍යාව | 2711 | 3027 | 3142 |
| ඉංජිනේරු විද්‍යාව | 1344 | 1617 | 1713 |
| වෛද්‍ය විද්‍යාව | 1145 | 1135 | 1176 |
| දන්ත ශල්‍ය විද්‍යාව | 79 | 91 | 148 |
| පශු වෛද්‍ය විද්‍යාව | 69 | 73 | 79 |
| කෘෂිකර්ම විද්‍යාව | 710 | 799 | 742 |
| ගෘහ නිර්මාණ හා ප්‍රමාණ සමීක්ෂණය | 77 | 224 | 355 |
| පරිගණක විද්‍යාව | 1043 | 946 | 1153 |
| උපාධි ලබාගත් සංඛ්‍යාව (විද්‍යා, ගණිත, තාක්ෂණ) | 7178 | 7912 | 8508 |
| උපාධි ලබා ගත් මුළු සංඛ්‍යාව | 25,676 | 29,083 | 30,668 |
| උපාධිය ලබා ගත් සිසුන්ගෙන් විද්‍යා,ගණිත ,තාක්ෂණ උපාධි ලබා ගත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | 28% | 27% | 28% |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා**

ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය සියයට 27.5 (2016), ගෝලීය නවොත්පාදන දර්ශකයේ ශ්‍රී ලංකාව රටවල් 127 කින් 90 වන ස්ථානයේ පැවතීම හා පර්යේෂණ හා සංවර්ධන වියදම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.1 ක් (2013) වීමෙන්, තිරසර සංවර්ධන අරමුණු 09 හි ඉලක්ක 5 යටතේ විද්‍යාත්මක පර්යේෂණ වැඩිකිරීම, කර්මාන්ත අංශයේ තාක්ෂණ ධාරිතාවය ඉහළ නැංවීම, නවෝත්පාදනය, පර්යේෂණ සිදුකරන පුද්ගලයන් සංඛ්‍යාව වැඩිකිරීම, රජයේ හා පෞද්ගලික අංශයේ පර්යේෂණ වියදම වැඩිකිරීම යන කාර්යයන් කළ යුතු වුවත් එම තත්ත්වය ශ්‍රී ලංකාවේ ඉතාමත් අඩු මට්ටමක පවතී. ඒ අනුව ශ්‍රී ලංකාව ඉහත ඉලක්කයට ළඟාවීම සඳහා දේශීය ධාරිතා වර්ධනය කර ගැනීමට රජය හා පෞද්ගලික අංශය අවධානය යොමුකළ යුතුය.

### (ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තිරසර සංවර්ධනය උදෙසා මූල්‍ය ප්‍රවර්ධනය

මූල්‍ය ආයතන හා බැංකු ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහායවීම තුලින් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා කාර්යභාරයක් කරන අතර, එයින් ආර්ථික, සාමාජික හා පාරිසරික බලපෑම් ඇතිවේ. මූල්‍ය ආයතන විසින් ස්වාභාවික පරිසරය වෙත අවදානම් ජනිත කරන බව මූල්‍ය අංශය දැනුවත් වී ඇති අතර ඒ හේතුවෙන් මෑත දශක කිහිපය තුල තිරසාර මූල්‍යකරණ ප්‍රතිපත්ති වැඩිදියුණු වී ඇත.

i. අවදානම් කළමණාකරණය - මූල්‍ය ප්‍රදාන - පරිසරයට හා ජනතාවට වන අවදානම වැලැක්වීම.

ii. ණය උත්පාදනය - පරිසර හිතකාමී සමාජීය වගකීමෙන් යුතු ව්‍යාපාර සඳහා ණය ලබාදීම.

කළමණාකරණය හා ණය උත්පාදනය සඳහා ඉදිරි දැක්මක් සම්පාදනය කරමින් පවතින බව 2016 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ දක්වා ඇත. එමගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සඳහා මඟ පෙන්වීම තුලින් ඒ අයගේ සහයෝගය ලබාගෙන තිරසාර සංවර්ධනයට දායකවීමට බලාපොරොත්තු වන බව දක්වා ඇත. 2016 වර්ෂයේ තිරසර සංවර්ධනයට උපදෙස් හා තිරසාර මූල්‍ය ප්‍රවර්ධනය කිරීම යටතේ අවදානම් කළමනාකරණය ණය උත්පාදන ඉදිරි දැක්ම පිළිබඳව මහ බැංකු වාර්තාවේ සඳහන් කර ඇතත් 2017 හා 2018 වර්ෂවල එම දැක්ම අනුව නියාමන ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

## 3.4 2030 න්‍යාය පත්‍රය පසුවිපරම, සමාලෝචනය, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කිරීම

### 3.4.1 ප්‍රගතිය නියාමනය

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු ලඟා කරගැනීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට පෙර ශ්‍රී ලංකාව සහශ්‍ර සංවර්ධන අරමුණු කරා ලඟා වූ ආකාරය පරීක්ෂා කළ යුතුය. ඒ සම්බන්ධව සකස් කළ සහශ්‍ර සංවර්ධනය සම්බන්ධ ශ්‍රී ලංකා වාර්තාව අනුව ප්‍රගතිය පහත පරිදි වේ.

### (අ) සහශ්‍ර සංවර්ධන අරමුණු කරා ලඟා වීම (2000-2015)

2000 වර්ෂයේ ආරම්භ කළ 2015 වර්ෂයේ අවසන් වූ සහශ්‍ර සංවර්ධන අරමුණු 08 හා ඉලක්ක 44 න් ශ්‍රී ලංකාව ළඟා කරගෙන ඇත්තේ ඉලක්ක 13 ක් බව 2014 වර්ෂයේ සහශ්‍ර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකා වාර්තාවේ දක්වා ඇත. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට තම සැලසුම් සකස් කිරීමේදී වගකිව යුතු ආයතන ශ්‍රී ලංකාව ළඟා කරගත් සහශ්‍ර සංවර්ධන අරමුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ඒ පිළිබඳ

අවධානය යොමුකළ යුතු ඉලක්ක හා එම ඉලක්ක වල වර්තමාන තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී අරමුණු 2.1, 6.1, 6.5, 7.9, 7.10 හැරුණුවිට අනෙකුත් අරමුණු වල ප්‍රගතිය ප්‍රමාණවත් නොවන අතර ඒ සම්බන්ධව අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් තිරසර සංවර්ධන අරමුණු කරා ගමන් කිරීමේදී පවතින ගැටලු හඳුනාගෙන ඒ සඳහා නිසි ප්‍රතිකර්ම යෙදිය හැකිය. ඒ පිළිබඳ තොරතුරු උපලේඛන 5 හි දැක්වේ.

**(ආ) නියාමනය, පසු විපරම, සමාලෝචනය සහ වාර්තාකරණය පිළිබඳ වගකීම් සහ යාන්ත්‍රණ**

2030 න්‍යාය පත්‍රයෙහි පසු විපරම, ප්‍රගතිය හා සමාලෝචනයක අවශ්‍යතාව නිශ්චය කර ඇත. 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව, 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනයට, පසු විපරමට, සමාලෝචනයට හා වාර්තාකරණයට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට නෛතික ප්‍රතිපාදන සලසා ඇත. INTOSAI ප්‍රමිත අංක 5130 හි 2.22 අනුව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා ක්‍රමවේද රජය පැහැදිලිව හඳුනාගත යුතු බව දක්වා ඇත. මෙහිදී ප්‍රගතිය මැනීම සඳහා තිරසර සංවර්ධන සභාව විසින් ඉලක්ක වලට දර්ශක සකස් කිරීම හා පාදක දත්ත රැස් කිරීම මගින් තිරසර සංවර්ධන අරමුණු සමාලෝචනය, නියාමනය හා වාර්තාකරණ රාමුවක් සකස් කළ යුතුය. නමුත් 2019 නොවැම්බර් දක්වා ඒ පිළිබඳ නියාමන හා වාර්තාකරණ රාමුවක් සකස් කර නොතිබුණි.

**(ඇ) කාර්යසාධන දර්ශක හා දත්ත**

මනා දර්ශක රාමුවක් තිරසර සංවර්ධන අරමුණු සහ එහි ඉලක්ක, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය දියුණු කිරීමට, සම්පත් වෙන්කිරීමට, තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ ප්‍රගතිය මැනීමට සහ සියලු සාන්ද්‍රික ප්‍රජාවගේ ගිණුම් කටයුතුභාවය තහවුරු කිරීමට කළමනාකරණ කාරකයක් ලෙස යොදා ගනී. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා දර්ශක හා පාදක දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත. විස්තර පහත පරිදි වේ.

| වර්ගීකරණය | දර්ශක සංඛ්‍යාව |
|---|---|
| දැනටමත් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (ජ.හා.සං.දෙ.) විසින් සකස් කළ දර්ශක | 49 |
| (ජ.හා.සං.දෙ.) විසින් සකස් කළ යුතු දර්ශක | 26 |
| පවත්නා හෝ වෙනත් ආයතන විසින් සකස් කළ යුතු දර්ශක | 131 |
| ප්‍රාදේශීය/ ගෝලීය දර්ශක | 35 |
| ශ්‍රී ලංකාවට අදාළ නොවන දර්ශක | 03 |
| **එකතුව** | **244** |

**මූලාශ්‍රය : තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක තත්ත්වය -2017**

**(ඇ)** දැනටමත් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති දර්ශකවල විස්තර පහත දැක්වේ.

| අරමුණ(Goal) | දර්ශකය (Indicators) |
|---|---|
| අරමුණ 1 | 1.1.1, 1.2.1, 1.2.2, 1.3.1 |
| අරමුණ 2 | 2.1.2, 2.2.1, 2.2.2 |
| අරමුණ 3 | 3.1.1, 3.1.2, 3.2.1, 3.2.2, 3.4.1, 3.4.2, 3.6.1, 3.7.1, 3.7.2, 3.8.2, 3.c.1 |
| අරමුණ 4 | 4.2.2, 4.4.1, 4.a.1, 4.c.1 |
| අරමුණ 5 | 5.1.1, 5.2.1, 5.3.1, 5.5.2,5.2.2 |
| අරමුණ 6 | 6.1.1 |
| අරමුණ 7 | 7.1.1 |
| අරමුණ 8 | 8.1.1, 8.2.1, 8.5.2, 8.6.1, 8.7.1 |
| අරමුණ 9 | 9.1.1, 9.2.1, 9.2.2, 9.3.1 |
| අරමුණ 10 | 10.1.1, 10.2.1, 10.4.1 |
| අරමුණ 11 | 11.1.1 |
| අරමුණ 16 | 16.1.1, 16.1.3, 16.2.2, 16.3.2, 16.4.2 |

**(ඉ) තම විෂය පථය සඳහා වන දර්ශක ආයතන විසින්ම පිළියෙල කළ යුතු වීම**

ඉහත සඳහන් විශ්ලේෂණය අනුව අරමුණු 12, 13, 14, 15 සහ 17 සඳහා තිරසර සංවර්ධන දර්ශක, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් නොකරන ලද බව හා ඉලක්ක අරමුණ ඉටුකරගැනීම් හා මැනීම සඳහා තම විෂය පථය අනුව දර්ශක ආයතන විසින් පිළියෙල කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව එහි තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක තත්ත්ව වාර්තාවේ පළමු පිටපත 2017 ජුලි මාසයේදී ද 2 වැනි සංශෝධිත පිටපත 2017 දෙසැම්බර් මාසයේදී ද ප්‍රසිද්ධ කරන ලදී. ඉහත කී වාර්තාව පළකර දැනට වසර දෙකක කාලයක් ඉකුත් වී තිබෙන නමුත් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ඔවුන් විසින් සකස් කළ යුතු ඉතිරි දර්ශක 26 හි දත්ත සම්පාදනය කිරීමේ කාර්යයයේ තවමත් නිරතව සිටී.

(ii) තිරසර සංවර්ධන අරමුණු සඳහා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සකස් කළ දත්ත විශ්ලේෂණයේදී සමහර දර්ශක සඳහා සියලු පාර්ශවයන් නියෝජනය වන (Disaggregation) මට්ටම සතුටුදායක නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. උදා -

| දර්ශකය | දර්ශකයේ විස්තර | සියලු පාර්ශවයන් නියෝජනය වීමේ මට්ටම |
|---|---|---|
| දර්ශකය 4.a.1 | පහත සඳහන් ප්‍රවේශයන් ඇති පාසල් අනුපාතය | |
| | (අ) විදුලිය | |
| | (ආ) අධ්‍යාපන කටයුතු සඳහා අන්තර්ජාලය | අධ්‍යාපනික කටයුතු සඳහා අන්තර්ජාලය (පාදකයන් නොතිබීම) |
| | (ඇ) ඉගැන්වීමේ කටයුතු සඳහා පරිගණක | |
| | (ඈ) ආබාධිත සිසුන් සඳහා යටිතල පහසුකම් හා ද්‍රව්‍ය සලසා තිබීම | ආබාධිත සිසුන්ට යටිතල පහසුකම් හා අවශ්‍ය ද්‍රව්‍ය සලසා දීම (පාදකයන් නොතිබීම) |
| | (ඉ) මූලික පානීය ජලය | |
| | (ඊ) ස්ත්‍රී පුරුෂ සනීපාරක්ෂණ පහසුකම් | |
| | (උ) මූලික අත්සෝදන පහසුකම් (wash) දර්ශක නිර්වචනයට අනුව | මූලික අත්සේදීමේදී පහසුකම් (පාදකයන් නොතිබීම) |

| | | |
|---|---|---|
| දර්ශක 8.5.2 | ලිංගභේදය, වයස අනුව ආබාධිත පුද්ගලයන්ගේ රැකියා විරහිත අනුපාතය | ආබාධිත පුද්ගලයන් සඳහා පාදකයන් නොතිබීම. |
| දර්ශක 4.c.1 | යටත් පිරිසෙයින් අවම සංවිධිත ගුරු පුහුණුව සහිත පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික පහළ, ද්විතියික ඉහළ, ද්විතියික අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන්ගේ අනුපාතය | පූර්ව - ප්‍රාථමික ගුරුවරුන් නොසිටීම |

(iii) තිරසර සංවර්ධනය සාක්ෂාත් කරගැනීමට ආයතන විසින් පිළියෙල කළ යුතු දර්ශක 131 ක් සඳහා දර්ශක පිළියෙල කිරීමට දැනුමක් නොමැති වීම හේතු කොටගෙන දර්ශක විශාල සංඛ්‍යාවක් පිළියෙල කර නොතිබුණු අතර අදාළ ආයතනවලට තිරසර සංවර්ධනය කරා එළඹීමේ ප්‍රගතිය මැනීමට නොහැකි වී තිබුණි.

(iv) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් දත්ත එක්රැස් කර සකස් කිරීම මගින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා පාදක දත්ත ලබාගැනීමට සංගණනයන් කරමින් පවතී. ඒ සඳහා එම දත්ත 2019, 2020 හා 2021 වර්ෂයේදී භාවිතා කිරීමට බලාපොරොත්තු වන බව දක්වා තිබුණි. ඒ අනුව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉලක්ක 14 ක් සඳහා (1.4.1, 1.4.2, 2.1.1, 2.1.2, 4.3.1, 5.a.1(b), 5.b.1, 5.2.2, 5.4.1, 5.9.1, 6.2.1, 8.5.1, 8.9.1, 16.9.1 ) දර්ශකයන් ඉදිරියේදී සකස් කිරීමට නියමිතව පවතී.

### 3.4.2 අයවැය දර්ශක - 2019

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 ජූලි 17 දින ජාතික අයවැය චක්‍රලේඛ අංක 4/2018 යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශයේ 2 අනුව, රජයේ ආදායම් රැස්කිරීම ඉහළ නංවමින් පුනරාවර්ථන වියදම් තාර්කීකරණය කිරීම සහ මූලධන වියදම් ප්‍රමුඛගත කිරීම 2019 ආරම්භ කර 2021 වන විට අපේක්ෂිත ප්‍රධාන ඉලක්කයන් පහත දැක්වේ.

| අනු අංකය | ඉලක්කය | 2016 | 2017 | 2018 | 2019 | 2021 ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| i. | රජයේ ආදායමට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17 ක ප්‍රතිශතයක්වීම | 14.1% | 13.7% | 13.4% | දත්ත ප්‍රකාශයට පත්වී නොතිබුණි | 17 |
| ii. | අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.5 ක ප්‍රතිශතයක් වීම. | 5.3% | 5.5% | 5.3% | දත්ත ප්‍රකාශයට පත්වී නොතිබුණි | 3.5 |
| iii. | රජයේ ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 70 ක ප්‍රතිශතයක් වීම. | 78.3% | 76.9% | 82.9% | දත්ත ප්‍රකාශයට පත්වී නොතිබුණි. | 70 |

ඉහත ඉලක්ක කරා ගමන් කිරීම පරික්ෂාවේදී 2021 වර්ෂයේදී ඉලක්ක කරා ලඟාවීම සඳහා අදාල වගකීම ගත යුතු ආයතන තම සැලසුම් ඒ අනුව සකස් කල යුතුය. පවත්නා දර්ශක අනුව පවතින ප්‍රගතිය එතරම් සතුටුදායක තත්ත්වයක නොපවතින බව නිරීක්ෂණය විය.

### 3.4.3 තිරසර සංවර්ධන ඉලක්ක හා දර්ශක

INTOSAI ප්‍රමිත අංක 5130 හි 2.11 යටතේ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග වන්නේ ලඟාකරගත යුතු අරමුණු සඳහා ඉලක්ක සැකසීම හා ඒවා මැනීමට දර්ශක සකස් කිරීම වේ. ශ්‍රී ලංකාවද ආර්ථික, සාමාජීය හා පාරිසරික සංවර්ධන තත්ත්වයන් මැනීම සඳහා දර්ශක සකස් කර ඇත. එම සකස් කරන ලද දර්ශක ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පහත පරිදි වේ.

(අ) සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය

| අනු අංකය | දර්ශකය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| i. | අපනයන ආදායම - එ.ජ.ඩො.මිලියන | 10,310 | 11,360 | 11,889 |
| ii. | ආනයන වියදම - එ.ජ.ඩො.මිලියන | 19,400 | 20,979 | 22,232 |
| iii. | ගෙවුම් ශේෂ හිඟය - එ.ජ.ඩො.මිලියන | (500) | 2068 | (1,102) |
| iv. | විනිමය අනුපාතය - (එ.ජ.ඩො)වාර්ෂික සාමාන්‍ය | 145.6 | 152.4 | 162.5 |
| v. | රාජ්‍ය ණය රු.බිලියන | 9,387.3 | 10,313.04 | 11,977.5 |
| vi. | රාජ්‍ය ණය දල දේ. නිෂ්. ප්‍රතිශතයක් ලෙස සියයට | 78.3 | 76.9 | 82.9 |
| vii. | ඒක පුද්ගල දළ ජාතික ආදායම එ.ජ.ඩො. | 3,782 | 3,396 | 3,991 |
| viii. | රාජ්‍ය ආදායම - රු.බිලියන | 1,693.5 | 1,839.5 | 1,932.4 |
| ix. | රාජ්‍ය ආදායම දල.දේ. නිෂ්. ප්‍රතිශතයක් ලෙස සියයට | 14.1 | 13.7 | 13.4 |
| x. | රාජ්‍ය වියදම - රු.බිලියන | 2,333.9 | 2,573 | 2,693.2 |
| xi. | රාජ්‍ය වියදම දල දේ.නි.ප්‍රතිශතයක් ලෙස සියයට | 19.5 | 19.2 | 18.6 |
| xii. | අයවැය හිඟය- රු.බිලියන | (640.3) | (733.4) | (760.7) |
| xiii. | අයවැය හිඟය දල දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට | (5.3) | (5.5) | (5.3) |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා**

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා යාම පිළිබඳව ප්‍රගතිය මිනීම සඳහා මෙම දර්ශක භාවිතා කළ හැකි අතර එමගින් ශ්‍රී ලංකාවේ තත්ත්වය මැනීම කළ හැකිය. ඉහත දර්ශක අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ගැටළු පවතින බව නිරීක්ෂණය වේ.

### 3.4.4 දත්ත අධීක්ෂණය සහ වගවීම

තිරසර සංවර්ධන අරමුණු 17 හි ඉලක්ක 18 අනුව 2020 වන විට අවම වශයෙන් රටවල් උසස් ගුණාත්මක තත්ත්වයේ නිසිකලට නිකුත්වන විශ්වාසදායි දත්ත, ආදායම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජනවර්ගය, ජාතිකත්වය, සංක්‍රමණික තත්ත්වය, ආබාධිත බව, භූ විද්‍යාත්මක ස්ථානය යන අදාල සංදර්භයන් පදනම් කරගෙන වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ධාරිතාවන් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. නමුත් 2020 වර්ෂයට ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය වාර්තා කිරීමට අදාලව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සතුව පවතින්නේ ඉලක්ක 169 ක් වෙනුවෙන් සකස් කළ දර්ශක 49 ක් හා ඒ සඳහා පාදක දත්ත පමණි.

**(අ) තිරසර සංවර්ධන අරමුණු ප්‍රගතිය මැනීම**

අරමුණ 17 ඉලක්ක 19 යටතේ 2030 වන විට දැනට පවත්නා ක්‍රියාමාර්ග උපයෝගී කරගෙන දළ දේශීය නිෂ්පාදනයට අතිරේකව තිරසර සංවර්ධනයේ ප්‍රගතිය මැනීමට මිනුම් සංවර්ධනය කිරීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංඛ්‍යාත ධාරිතාවයක් ගොඩනැංවීම යටතේ ශ්‍රී ලංකාවේ තත්ත්වය පහත පරිදි වේ.

**(ආ) ආර්ථික වර්ධනය**

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

| වර්ෂය | දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන අනුපාතය | 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන අනුව ඉලක්ක |
|---|---|---|
| 2015 | 4.8 | 4.8 |
| 2016 | 4.5 | 5.5 |
| 2017 | 3.4 | 6.0 |
| 2018 | 3.2 | 6.5 |
| 2019 | 2.7 | 7 |

**මූලාශ්‍රය - මහ බැංකු වාර්තා**

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ක්‍රමානුකූලව අඩු වෙමින් පවතින අතර එය රාජ්‍ය ආයෝජන වැඩසටහනේ (2017-2020) ඉලක්ක හා සැසඳීමේදී නිරීක්ෂණය වේ.

**(ඇ)** දකුණු ආසියානු කලාපය තුළ අවම ආර්ථික වර්ධන වේගයක් සහිත රට බවට මෑත කාලයේ ශ්‍රී ලංකාව පත් වී ඇත. විස්තර පහත පරිදි වේ.

| රට | 2017 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන අනුපාතය |
|---|---|
| බංගලිදේශය | 7.3 |
| ඉන්දියාව | 7.2 |
| චීනය | 6.9 |
| මැලේසියාව | 5.9 |
| පාකිස්තානය | 5.7 |
| භූතානය | 4.6 |
| තායිලන්තය | 3.9 |
| ශ්‍රී ලංකාව | 3.4 |

**මූලාශ්‍රය -ලෝක බැංකුවේ දර්ශකය - 2019**

**3.4.5 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දර්ශක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක වල ප්‍රගතිය**

**(අ) ප්‍රගතිය මැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීම**

INTOSAI ප්‍රමිත අංක 5130 හි 2.12 හා 2.13 අනුව පාදක දත්ත හා දර්ශක අන්තර් ජාතික ප්‍රමිති වලට අනුගත වීම, දර්ශක තුලට අරමුණ සම්බන්ධ වීම, පාදක දත්තවල විශ්වාසවන්තභාවය, ඉලක්ක කරා ලඟාවිය යුතු කාලය සඳහන් කිරීම, ලඟාවීම් මැනීම, ලඟාවීම් මැනීමේ වගකීම පැවරීම, ප්‍රතිඵල ඉලක්ක සමඟ සැසඳීම හා ප්‍රතිඵල වාර්ථා කිරීම (ව්‍යවස්ථාදායකට, ජනතාවට) කල යුතුය. ඒ සම්බන්ධව 2019 වර්ෂයේ දෙසැම්බර් 15 දින දක්වා දක්වා නිශ්චිත ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

**(ආ) පවත්නා දත්ත වලට අනුව ප්‍රගතිය**

ඒ අනුව දැනට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සතු පාදක දත්ත සහිත දර්ශක 49 ක් යටතේ තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය විග්‍රහ කිරීමේදී අරමුණු 1,2,3,4,6,7 පමණක් ප්‍රගතිය සතුටුදායක මට්ටමක පැවති අතර අරමුණු 5,8,9,10,11 හි ප්‍රගතිය සතුටුදායක නොවීය. තවද අරමුණු 12,13,14,15,16,17 ප්‍රගතිය මැනීමට අවශ්‍ය දර්ශක හා පාදක දත්ත නොමැති වීම නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 6 හි දැක්වේ.

**3.4.6 තිරසර සංවර්ධන අරමුණු කරා ගමන් කිරීමේ ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක භාවිතය**

---

**(අ) චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස්**

තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීම පරික්ෂාව සඳහා රාජ්‍ය ආයතනවලට කාර්යසාධන දර්ශක (KPI) භාවිතා කල හැක. 2018 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අයවැය ඇස්තමේන්තුවල සංවර්ධන ක්‍රියාකාරකම්වල (ව්‍යාපෘතිවල) තිරසර සංවර්ධන අරමුණුවල ප්‍රධාන ඉලක්කවලට අමතරව ප්‍රධාන කාර්යසාධන දර්ශක දක්වා ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ ජූලි 25 දින අංක 2/2017 ජාතික අයවැය චක්‍රලේඛය 3 ප්‍රකාරව කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ක්‍රමවේදය අනුව, 2018 අයවැය පසුගිය වර්ෂයන්හි ක්‍රියාත්මක කල ශූන්‍ය පාදක අයවැයකරණ ක්‍රමයේ අත්දැකීම් මත පදනම්ව කාර්යසාධනය මත පාදක වූ අයවැයකරණ ක්‍රමවේදය අනුව සම්පාදනය කරන බව දක්වා තිබුණි. එහි අංක 4

අනුව අවසන් ප්‍රතිඵලයන් හා ගලපන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) නිශ්චිතව තීරණය කල හා මැනිය හැකි ප්‍රතිඵල ලඟාකර ගැනීම සඳහා සම්පත් වෙන්කිරීම සිදුකරයි. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 ජූලි මස 17 දින ජාතික අයවැය චක්‍රලේඛ අංක 4/2018 දරන වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ 3 යටතේ කාර්යසාධනය පදනම් කරගත් අයවැය සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක යටතේ 2019 අයවැය සකස් කිරීම සිදුකරන බව දක්වා තිබුණි.

**(ආ) කාර්යසාධන දර්ශක වල ප්‍රගතිය ඇගයීම**

අමාත්‍යාංශ විසින් තම ව්‍යාපෘතිවලට අදාල අරමුදල් ඉල්ලීම් කිරීමේදී අදාල අමාත්‍යාංශය විසින් කාර්යසාධන දර්ශක අනුව ප්‍රගතිය මැනීම සිදුකර ඒ බව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම හා එම ඇගයීම මත ජාතික අයවැය දෙපාර්තමේන්තුව අරමුදල් වෙන්කිරීම සිදුකිරීම කල යුතුය. ඉහත චක්‍රලේඛ අනුව කටයුතු කිරීම සම්බන්ධ ප්‍රගතිය පරීක්ෂාව සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලද ලිපියට ලද පිළිතුරු අනුව ඒ ඒ අමාත්‍යාංශ වලට අදාළ කාර්යසාධන දර්ශක ජාතික අයවැය දෙපාර්තමේන්තුවට එවා තිබුණු බවත් ඒ අනුව 2018 හා 2019 වර්ෂවල ව්‍යාපෘති වලට අදාල කාර්යසාධන දර්ශක වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බව දක්වා තිබුණි. කාර්යසාධන දර්ශක වල ප්‍රගතිය අදාල රේඛීය අමාත්‍යාංශ විසින් මැන බැලිය යුතු බව ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදාල පිළිතුරෙහි දක්වා තිබුණි. ඒ අනුව අදාළ කාර්යසාධන දර්ශකවල 2018 හා 2019 යන වර්ෂ වල ප්‍රගතිය ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හෝ අදාල අමාත්‍යාංශ විසින් මැන බලා වාර්තා කිරීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

### 3.4.7 ස්වෙච්ඡා ජාතික සමාලෝචනය

2017 වර්ෂයේදී තිරසර සහ නම්‍යශීලී සමාජයයන් දෙසට පරිවර්තනය වීම යන තේමාව යටතේ (Trans formulation towards sustainable and resilient societies) ශ්‍රී ලංකාව එහි පළමු ස්වේච්ඡා ජාතික සමාලෝචනය තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් 2018 ජූලි මාසයේදී එක්සත් ජාතීන්ගේ ඉහල පෙලේ දේශපාලන සම්මේලනයට ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු 1 සිට 16 දක්වා ප්‍රගතිය පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී අරමුණු 1 සිට 4 දක්වා ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතින අතර, අරමුණු 5 සිට 12 දක්වා ප්‍රගතිය සැලකිය යුතු ප්‍රමාණයක පැවතුනත් අරමුණු 13 සිට 16 දක්වා ප්‍රගතිය ඉතාමත් අඩු මට්ටමක පවතී. අරමුණු 17 සම්බන්ධ නිරීක්ෂණ මෙම වාර්තාවේ දක්වා නොතිබුණි. ස්වේච්ඡා ජාතික සමාලෝචනය තුළ

ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට අදාළ ඉලක්ක සපුරා ගැනීම පිළිබඳව පරීක්ෂා කර තිබුණි. එහිදී නිරීක්ෂණය වූ විශේෂ කරුණු පහත දැක්වේ.

දිළිඳුකම පිටුදැකීමේ ජාත්‍යන්තර දරිද්‍රතා දර්ශකයෙන් පහළ සිටින ජනගහනය හා ජාතික දරිද්‍රතා අනුපාතය අඩු වුවත් ප්‍රාදේශීය විෂමතා පැවතීම, දිළිඳු පුද්ගලයන් ස්වභාවික ආපදා වලට ගොදුරු වීම, දේශගුණික බලපෑම් නිසා ආහාර නිෂ්පාදනය අඩු වීම, දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික කොටස අඩුවීම, පර්යේෂණ අඩුවීම, මාතෘ මරණ අනුපාතය අඩු වුවත් ප්‍රාදේශීය විෂමතා පැවතීම, ලිංගික අධ්‍යාපන දැනුම අඩුවීම, උසස් පෙළ හදාරණ සිසුන්ගෙන් සියයට 50 ට වැඩි ප්‍රමාණයක් කලා විෂය ධාරාව හැදෑරීම, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි යන විෂයයන් සඳහා ගුරු හිඟය, කාන්තා ශ්‍රම දායකත්වය අඩුවීම, වැටුපක් නොලබන ගෘහස්ථ කාන්තා ප්‍රතිශතය වැඩිවීම, පාර්ලිමේන්තු කාන්තා නියෝජනය අඩුවීම, කාන්තා විධායක සේවා නියුක්තිය අඩුවීම, පානීය ජලයේ ගුණාත්මක බව අඩුවීම නිසා රෝග ඇතිවීම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ ප්‍රතිශතය අඩුවීම, අධ්‍යාපනය නොලබන, පුහුණුවක් හා රැකියා නොකරන තරුණ ජනගහනය වැඩිවීම, විදේශ වෙළඳපලට ඇතුළුවීම අපහසුවීම, සංවර්ධන ආධාර අඩුවීම, ජගත් සංවිධාන තුල ශ්‍රී ලංකා නියෝජනය අඩුවීම, අපනයන විවිධාංගීකරණය නොවීම, සැලසුම්ගත නොවූ නාගරික සංවර්ධනය, තිරසර පාරිභෝජන හා නිෂ්පාදන ක්‍රම ගැන ජනතාවගේ දැනුවත්භාවය අඩුවීම, අපද්‍රව්‍ය කළමනාකරණය දුර්වලවීම, කාලගුණ විපත් වැඩිවීම, වනාන්තර, සාගර හා වෙරළ සංරක්ෂණ නීතිවල දුර්වලතා පැවතීම, පරිසර පද්ධති පිළිබඳ තොරතුරු හිඟ වීම, නීති ප්‍රමාණවත් නොවීම, ආයතන අතර සම්බන්ධීකරණය අඩුවීම, ප්‍රගතිය ඇගයීම සඳහා යාවත්කාලීන තොරතුරු නොමැති වීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ තොරතුරු එක් ස්ථානයකට රැස්කරන ජාතික දත්ත පද්ධතියක් නොමැතිවීම, තෙත් බිම් විනාශවීම, ජාත්‍යන්තර දූෂණ දර්ශකයේ ශ්‍රී ලංකාවේ ස්ථානය මෑත වර්ෂවල ඉහල අගයකට ඒම දක්වා තිබුණි. විස්තර උපලේඛන 7 හි දැක්වේ.

ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ අඩංගු වී ඇති ප්‍රශ්න හඳුනාගෙන ඒවාට විසඳුම් සොයාගැනීම මගින් තිරසර සංවර්ධන අරමුණ කරා ළඟා විය හැක. එම වාර්තාවේ අඩංගු කරුණු අනුව රාජ්‍ය ආයතන තම විෂය පථය තුලට අදාළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඇතුළත් කර ඒ සඳහා දර්ශක හා පාදක දත්ත ගොඩනගා ගැනීමෙන් තම ආයතනවල ප්‍රගතිය වාර්ෂිකව මැන බැලිය හැක. එම දර්ශක හා පාදක දත්ත අදාළ වාර්තා කිරීමේ වගකීම පවතින තිරසර සංවර්ධන සභාව වෙත යොමු කිරීමෙන් රටේ සමස්ථ තිරසර සංවර්ධන ප්‍රගතිය මැනිය හැකිය. එම වාර්තාවේ කරුණු අනුව ඉලක්ක වැඩි ගණනකට අදාලව දේශීය වශයෙන් දර්ශක හා පාදක දත්ත නොතිබුණි. ඒ අනුව ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය ඉදිරි වර්ෂවලදී ජාත්‍යන්තරයට හා රටේ පාර්ලිමේන්තුවට, ජනතාවට දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමේදී ගැටලු පැන නැගිය හැක.

## 04. නිර්දේශ

4.1 රජයේ ආයතන ඔවුන්ගේ විෂයපථයන්ට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු හා උපක්‍රමය පිළියෙල කිරීමට අදාළ තොරතුරු තිරසර සංවර්ධන සභාවට ලබාදීමෙන් තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තිය හා උපක්‍රමය පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

4.2 ජාතික අයවැය ලේඛනය මගින් දක්වා ඇති කාර්යසාධන දර්ශක (KPI) අදාල ආයතන සමග සම්බන්ධ වී මැනීමේ ක්‍රමයක් සංවර්ධනය කිරීම.

4.3 ජාතික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයේදී 2019 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන සෞභාග්‍යයේ දැක්ම තුළ තිරසර සංවර්ධන ජාතික සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අමාත්‍යාංශ නැවත සකස් කිරීම පිළිබඳව තිරසර සංවර්ධන සභාව විසින් නියාමනය කිරීම.

4.4 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා පාරිසරික පැතිකඩ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

4.5 තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමේදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට ලබාදෙන සුබසාධන පහසුකම් වැඩිකිරීම

4.6 ඉලක්ක සපුරාගැනීම සඳහා සම්පත් ඉල්ලා සිටීමට පහසු වනු පිණිස රාජ්‍ය ආයතනවලට පැහැදිලි ලෙස චක්‍රලේඛ නිකුත් කිරීම.

4.7 රජයේ ආයතන විසින් පිළියෙල කළ යුතු දර්ශක 131 පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම, පුහුණුව ලබාදීම හා ඒ පිළිබඳ පසු විපරම් කිරීම.

4.8 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු දර්ශක 26 ක් සඳහා දත්ත සංග්‍රහයක් පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

4.9 තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාවේ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රජයේ ආයතනවල සම්බන්ධීකරණය වැඩි කිරීම.

4.10 තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ සමස්ථ ප්‍රගතිය නියාමනය හා ඇගයීමට හැකි ලෙස නියාමන හා ඇගයීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම

4.11 තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය කාලීනව වාර්තා කිරීමේ ක්‍රමයක් සකස් කිරීම හා ඒවා මහජනතාවට හා ඒ සම්බන්ධයෙන් ඇල්මක් දක්වන පාර්ශවයන්ට ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම.

## 05. නිගමනය

ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය හා උපක්‍රමය පිළියෙල නොකිරීම, සියලු පාර්ශව නියෝජනය වන ආකාරයට දත්ත නොමැතිවීම ,ආයතන මට්ටමින් හා ජාතික මට්ටමින් කාර්යසාධන දර්ශක පිළියෙල කර මැනීමක් සිදු නොකිරීම, ශ්‍රී ලංකාවේ දැක්ම (2025) අනුව දක්වා තිබූ ඉලක්ක 4 න් ඉලක්ක 3 ක් කරා ළඟා වීමට ශ්‍රී ලංකාවට දැඩි පරිශ්‍රමයක් දැරිය යුතු වීම. තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පැවති පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව 2018 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක නොවීම, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ සමස්ථ ප්‍රගතිය නියාමනය හා ඇගයීමට යාන්ත්‍රණයක් සකස් කර නොතිබීම නිරීක්ෂණය විය. ඒ අනුව ශ්‍රී ලංකාවට තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට තවදුරටත් ඇත්තේ වර්ෂ 10 ක පමණ කාලයක් වන බැවින් තිරසර ජාතික ප්‍රතිපත්තියට ගැලපෙන ආකාරයට, 2019 වර්ෂයේ සෞභාග්‍යයේ දැක්ම තුළ ජාතික සැලසුමක් සකස් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2020 ජූලි 21 දින

උපලේඛන 01

**2019 අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාළ ප්‍රතිපාදන**

| අනු අංකය | අමාත්‍යාංශය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය රු.මිලියන | ඉලක්කය | කාර්යසාධන දර්ශක | තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| 1 | මුදල් අමාත්‍යාංශය | කුඩා හා මධ්‍යම ව්‍යාපාර සඳහා ණය දීම. | 9,330 | 1.4 | ණය භාවිත ප්‍රතිශතය | ආර්ථික සම්පත් සඳහා සැම දෙනාටම ප්‍රවේශ අයිතිය තහවුරු කිරිම. |
| | | ජය ඉසුරු ණය | 3,000 | 1.4 | එම | එම |
| | | සොඳුරු පියස ණය | 1000 | 1.4 | ඉදිකළ නිවාස ගණන | එම |
| | | රන් අස්වනු ණය | 900 | 1.1 | ලබාදුන් ණය ප්‍රමාණය | දිළිඳුකම පිටු දැකීම |
| | | | | 1.2 | නව තාක්ෂණය භාවිතයට හුරු වූ ගොවීන් ප්‍රමාණය | දිළිඳුකම පිටු දැකීම |
| | | රිය ශක්ති ණය | 500 | 1.4 | බස් මිලදී ගත් ප්‍රමාණය | ආර්ථික සම්පත් සැම දෙනාටම ප්‍රවේශ අයිතිය තහවුරු කිරිම |
| 2. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, නැගෙනහිර පළාත් සංවර්ධනය, වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය | ජලය, විදුලිය, කෘෂිකාර්මික පහසුකම් , පාරවල් | 2500 | 1.4 | ප්‍රතිලාභ ලැබූ පවුල් ගණන, ජීවන තත්ත්වය උසස් කරගත් පවුල් ගණන | -එම- |
| | | ගම් පෙරළිය සීග්‍ර සංවර්ධන වැඩසටහන | 48,000 | 1.4 | ඉදිකරන ලද ජලාශ, ඇල මාර්ග, ක්‍රීඩා පිට්ටනි, ජල ව්‍යාපෘති, ළමා උද්‍යාන, පන්සල් නිවාස ගණන | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3. | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය | 520 | 1.1 | ව්‍යාපෘතියෙන් කෙලින්ම ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව | දුප්පත්කම පිටු දැකීම. |
| 4. | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | බිම් සවිය වැඩසටහන | 420 | 1.4 | මනින ලද ඉඩම් කැබලි ගණන, තීරණ ගන්නා ලද ඉඩම් කැබලි ගණන | ආර්ථික සම්පත් සඳහා සැම දෙනාටම ප්‍රවේශ අයිතිය තහවුරු කිරීම. |
| 5. | ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | සමෘද්ධි වැඩසටහන | 50,000 | 1.1 | සමෘද්ධි මුදල් ලබාදුන් පවුල් ගණන | දිළිඳුබව පිටු දැකීම. |
| | | සමෘද්ධි ලාභීන් බලගැන්වීම | 750 | 1.4 | බල ගැන්වූ පවුල් ගණන | ආර්ථික සම්පත් සඳහා සැම දෙනාටම ප්‍රවේශ අයිතිය තහවුරු කිරීම. |
| | | වැඩිහිටියන්ට මුදල් ලබාදීම. | 10000 | 1.1 | මුදල් ලැබූ වැඩිහිටියන් ගණන | දිළිඳුබව පිටු දැකීම. |
| 6. | සංවර්ධන ක්‍රමෝපාය හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය | ඉඩම් කළමනාකරණ වැඩසටහන | 100 | 1.4 | ආවරණය කරන ලද ඉඩම් ප්‍රතිශතය | -එම- |
| | | | ------- | | | |
| | | | 127,020 | | | |
| | | | ======= | | | |

**උපලේඛන 02**

## 2018 වර්ෂයේ අමාත්‍යාංශ විසින් සළකා නොබලන ලද ඉලක්ක

| අනු අංකය | අරමුණ | අරමුණ හඳුනාගත් අමාත්‍යාංශ ගණන | අරමුණට අදාළ ඉලක්ක ගණන | හඳුනා නොගත් ඉලක්ක ගණන | හඳුනා නොගත් ඉලක්කවලට අදාළ විස්තරය |
|---|---|---|---|---|---|
| i. | 1 | 5 | 7 | 2 | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට සම්පත් ලබාගැනීම.<br>ජාතික, කලාපීය අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති නිර්මාණය |
| ii. | 2 | 7 | 8 | 2 | දෝහා න්‍යාය පත්‍රය ප්‍රකාරව අපනයන දිරි ගැන්වීම.<br>ආහාර නිෂ්පාදන වෙළඳපොල නිර්මාණය කිරීම. |
| iii. | 3 | 7 | 13 | 4 | බෝ නොවන රෝග, රෝගීන් හා මරණ අඩු කිරීම.<br>ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය<br>දුම්කොල භාවිතය පාලනය<br>සෞඛ්‍ය අවධානම් පූර්ව දැනුම් දීම ශක්තිමත් කිරීම. |
| iv. | 4 | 9 | 10 | 1 | විදේශ ශිෂ්‍යත්ව වැඩි කර ගැනීම. |
| v. | 5 | 4 | 9 | 5 | ගෙවීම් නොකරන සේවා සඳහා සමාජ සේවා ආරක්ෂන, යටිතල පහසුකම් ලබාදීම තුලින් ප්‍රතිලාභ ලබාදීම<br>බීජිං සැලැස්ම අනුව ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පහසුකම් ලබාදීම.<br>සියළු දෙනාට සම්පත් හිමිකාරීත්වය ලබාදීම<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ලබාදීම.<br>කාන්තා සවිබල ගැන්වීමේ ප්‍රතිපත්ති සම්පාදනය |
| vi. | 6 | 5 | 8 | 2 | ජලය සම්බන්ධ ජීව පද්ධති ආරක්ෂා කිරීම<br>ජලය, සනීපාරක්ෂක කටයුතු පිළිබඳ ව්‍යාපෘති වලදී දේශීය හා ප්‍රජා සහභාගීත්වය දිරි ගැන්වීම. |
